# <u>2021 සැප්තැම්බර් මස 22 වන දින පැවති</u>

## <u>හතළිස් එක් වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව</u>

දිනය :-2021.09.22

ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව

වේලාව :- පෙ.ව 10.00

සහභාගී වූ :-

| | | | |
|---|---|---|---|
| 01. | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 02. | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 03. | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 04. | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 05. | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 06. | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 07. | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 08. | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 09. | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 10. | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| 11. | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| 12. | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| 13. | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| 14. | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |
| 15. | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණි බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| 16. | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| 17. | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| 18. | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණි බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

දන්වා සහභාගී නොවූ:-

| | | | |
|---|---|---|---|
| 19. | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 20. | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| 21. | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |

නිළධාරීන්:-

01. ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා

02. විෂය භාර කළමණාකරන සේවා නිළධාරී අයි.ජී.සී.නයෝමී වීරකෝන් මිය

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**<u>2021.08.20 මහ සභා කෙටුම්පත් වාර්ථාව</u>**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2021.08.20 වන දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2021.08.20 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> 2021.08.20 දින පැවති මහ සභාවේ කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

<u>සංශෝදන</u>

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> 2021 සංවර්ධන වැඩසටහන් - පළාත් පාලන දෙපාර්තමේන්තුව ( නව වැඩ) යටතේ මෙම පළාත් පාලන ආයතනයට අදාලව යෝජනා කර තිබූ ව්‍යාපෘති අංක 21/611/03/02/2005/24(i)/N/A/03 දරණ නිදන්ගල මාර්ගය මීටර් 700 අළුත්වැඩියාව හා සංවර්ධනය කිරීම හා ව්‍යාපෘති අංක 21/611/03/02/2005/24(i)/N/A/04 දරණ 5 ඇල අතුරු මාර්ගය ප්‍රභාත් මහතාගේ නිවස අසල සිට මීටර් 100 ක් කොන්ක්‍රීට් කිරීම යන ව්‍යාපෘති දෙකම වෙනුවෙන් රු 1,000,000 මුදලක් වෙන් කර ඇතත් මාර්ග 02 හි දිග ප්‍රමාණය අතර වෙනසක් පවතින බවත්, එහි සංශෝධන විය යුත්තක් පවතින්නේ ද යන්න විමසන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මෙම සටහනේ දක්වා ඇත්තේ අනුමත කර එවූ ලිපියේ සඳහන් පරිදී බවත්, ඇස්තමේන්තු සකස් කිරීමේ වටිනාකම මෙහි සටහන් වී නොමැති බවත්, නිදන්ගල මාර්ගය පළුදු ස්ථාන අළුත්වැඩියාව සිදු කිරීමට මීටර් 700 නම් කර ඇතත්, 5 ඇල අතුරු මාර්ගය ප්‍රභාත් මහතාගේ නිවස අසල සිට මීටර් 100 ක් කොන්ක්‍රීට් කිරීම ව්‍යාපාතියේ සම්පූර්ණයෙන්ම කොන්ක්‍රීට් කිරීම සිදු කරන බවත් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> මෙම මාර්ගය තැන් තැන් වලින් අළුත්වැඩියා කිරීම තුල මාර්ගයේ කල් පැවැත්ම තබා ගත නොහැකි බවත්, හිමි වී ඇති ප්‍රතිපාදන තුල හැකි උපරිම දුර ප්‍රමාණයක් අළුත්වැඩියා කිරීම සුදුසු බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා පෙ.ව 10.07 මහ සභාවට පැමිණ අසුන් ගන්නා ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> සභා වාර්ථාව තුල සංශෝධන නොමැති නමුත් සම්පූර්ණ ප්‍රකාශ වාර්ථාවෙන් ඉවත් කර තිබෙන බවත්. තමන් විසින් සිදු ලෝකයේ සිටි ජොෂ්ඨ පුද්ගලයෙකු වන බර්ඩල් රෙස්ට් විසින් සිදු කල ප්‍රකාශයක් ඉදිරිපත් කලත් එය සටහන් කර නොමැති බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී සුභාෂිණි බංඩාර මැතිණිය පෙ.ව 10.10 පැමිණ අසුන් ගන්නා ලදී.

ඒ අනුව 2021.08.20 වන දින පැවති මහ සභා කෙටුම්පත් වාර්තාව ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය**

**01. නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා, ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා, ගරු මන්ත්‍රී එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් ලිපි මහ සභාවට නිවේදනය කරන ලදී.

**02. වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021 වර්ෂය සඳහා ගරු මන්ත්‍රීවරුන් විසින් වත්කම් බැරකම් ප්‍රකාශ මෙතෙක් ලබා දී නොමැති බැවින් කඩින් කඩ ඒ පිළිබඳව සිහි කැඳවීමේ ලිපි ලැබෙන බව සඳහන් කරමින් 2021 වර්ෂයට අදාල වත්කම් බැරකම් ප්‍රකාශ ලබා දීමට කටයුතු කරන මෙන් නිවේදනය කරන ලදී.

**03. කාන්තා කමිටු පිහිටුවීම.**

ගරු සභාපති එස් බී කුමාරදාස මැතිතුමා පළාත් පාලන සංසදය මගින් සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ එකමුතුවෙන් බල ප්‍රදේශයම ආවරණය වන පරිදී කාන්තා කමිටු පිහිටුවීමේ වැඩසටහනක් ආරම්භ කිරීමට නියමිත බවට වූ එම සංසදය මගින් යොමු කර තිබූ ලිපිය නිවේදනය කරන ලද අතර මේ සඳහා සභාවේ සියළුම ගරු මන්ත්‍රීවරුන්ගේ සහයෝගය අපේක්ෂා කරන බවටත්, මෙමගින් සෑම කොට්ඨාශයකම කමිටු ස්ථාපිත කිරීමට යෝජිත බවත්, සඳහන් කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා මෙම කමිටුව සභාව යටතේ පිහිටුවන කමිටුවක් නොවන බවත්, කාන්තා අභිවෘද්ධිය සඳහා ගම් මට්ටමින් පිහිටුවනු ලබන කමිටුවක් බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගුරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය පළාත් පාලන සංසදය මගින් ප්‍රාදේශීය සභාව හරහා කාන්තා කමිටු පිහිටුවීමේ අරමුණ වන්නේ බල ප්‍රදේශයේ කොට්ඨාශ 11 ආවරණය වන පරිදී ගරු මන්ත්‍රීතුමියන්ලාගේ ප්‍රධානත්වයෙන් කොට්ඨාශ ගරු මන්ත්‍රීතුමන්ලාගේද එකතුවෙන් කාන්තා කමිටුවක් ස්ථාපිත කිරීම බවත්, සෑම කොට්ඨාශයක් තුලම කාන්තා ස්වෙච්ඡා සංවිධාන පිහිටුවා තිබුණත් සංසදය මගින් ස්ථාපිත කල කමිටු මීට පෙර කිසි අවස්ථාවක ස්ථාපිත කර නොමැති බවත්, මෙමගින් කාන්තාවන්ගේ අධ්‍යාපනය, ආර්ථිකය ගොඩනංවාගන්නේ කෙසේද නායකත්වයට පුහුණු කිරීම, දේශපාලනයට මැදිහත්වන්නේ කෙසේද යන්න පිළිබඳ පුළුල් අරමුණු කරා ලගා වීමට අවශ්‍ය දැනුම හා අවබෝධය ලබා දීම අපේක්ෂාව බව දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාන්තා පුහුණු කටයුතු සිදු කරනු ලබන නිළධාරිනියද , සෞඛ්‍ය ක්ෂේත්‍රය නියෝජනය කරන්නන්, පොලිසියේ කාන්තා කටයුතු අංශයේ නිළධාරිනියක්, නීතීඥ වරියක් යන සෑම ක්ෂේස්ත්‍රයක්ම එකමුතුවෙන් මෙම කමිටු පැවැත්වීමට අපේක්ෂා කරන බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

**04. සෞභාග්‍යයේ දැක්ම ජාතික වැඩපිළිවෙල ක්‍රියාවට නැංවීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ජාතික වැඩපිළිවෙල ක්‍රියාවට නංවමින් රටේ සියළු ආර්ථික ක්ෂේත්‍රයන් හි නව පිබිදීමක් අපේක්ෂාවෙන් මුදල් අමාත්‍යාංශය හරහා පළාත් පාලන නියෝජිතයන් ලෙස සියළු දෙනා සතුටු විය යුතු ලෙස 2022 වර්ෂය සඳහා සෑම පළාත් පාලන මැතිවරණ කොට්ඨාශයකම දේශපාලන භේදයකින් තොරව පළාත් පාලන ආයතනයේ සෑම කොට්ඨාශයකම කොට්ඨාශය ජයග්‍රහණය කල ගරු මන්ත්‍රීවරයෙකු වෙතම විමධ්‍යගත මුදල් ලෙස පක්ෂ බේදයකින් තොරව රු 4,000,000.00 ලබා දීමට තීරණය කර ඇති බවත්, ඒ සඳහා කොට්ඨාශය තුල තිබෙන යෝජනා ලබා ගෙන

මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙසට කොට්ඨාශ ගරු මන්ත්‍රීවරයා වෙත උපදෙස් ලබා දී ඇති බවත්, පළාත් පාලන ආයතන ලෙස මෙය අප ලද විශාල ජයග්‍රහණයක් බවත්, මේ සම්බන්ධව මුදල් අමාත්‍යවරයාටත්, අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ආණ්ඩුවටත්, ස්තූතිවන්ත වෙමින් අදාල නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> ප්‍රාදේශීය සභාවට අයත්, එක් එක් කොට්ඨාශ තුල ආගමික නායකයින්ගේ , ප්‍රජාවගේ, ස්වේච්ඡා සංවිධාන වල නායකයින් , දේශපාලන අධිකාරිය සමඟ එක්වී ග්‍රාමීය කමිටු ආරම්භ කර රාජ්‍ය නිළධාරීන්ද සමඟ එක් වී සංවර්ධන යෝජනා මීට ඉහතදී ලබා ගෙන ප්‍රමුඛතාවය අනුව පෙල ගැස්වීම සිදු කල නමුත් එම යෝජනා මෙම විමධ්‍යගත මුදල් හරහා ක්‍රියාත්මක වන්නේ නැතිද යන්න විමසන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> එම යෝජනා LDSP ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ලබා ගත් යෝජනා බවත්, මෙම ප්‍රතිපාදන පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීවරයාට ලබා දෙන විමධ්‍යගත අරමුදල් ලෙසටම ක්‍රියාත්මක කර ගැනීමේ හැකියාව කොට්ඨාශ මන්ත්‍රීතුමාට පවතින බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> පාර්ලිමේන්තු , පළාත් සභා විමධ්‍යගත මුදල් යටතේ එක් එක් ක්ෂේත්‍ර සඳහා වෙන වෙනම යම් යම් ප්‍රමාණයන් වෙන් කර ඇති බැවින් මේ හිමි වන විමධ්‍යගත මුදල් සඳහා එවැනි යම් යම් ප්‍රමාණයන් වෙන් කර ඇතිද යන්න විමසන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මෙම විමධ්‍යගත මුදල් සඳහා අවධානය යොමු කල යුත් නිර්ණායක කිහිපයක් යොමු කර ඇති බව සඳහන් කරමින් එම නිර්ණායකද නිවේදනය කරන ලදී.

- ❖ ඔබගේ කොට්ඨාශය ග්‍රාම නිළධාරී වසම් කිහිපයකින් සමන්විත වූවත්, ඒ මත පදනම් නොවී කොට්ඨාශයේ ප්‍රමුඛතා හඳුනාගෙන යෝජනා සකස් කිරීම
- ❖ ග්‍රාම නිළධාරී වසම් මට්ටමින් වෙනම ඉදිරිපත් කරන සංවර්ධන යෝජනා නැවත මෙම ලැයිස්තුවෙන් ඇතුලත් නොකිරීම
- ❖ ග්‍රාමීය කමිටු සමඟ සාකච්ඡා කර එකඟතාවයකින් සංවර්ධන ප්‍රමුඛතා හඳුනා ගැනීම.
- ❖ යම් ව්‍යාපෘතියක් සඳහා අවශ්‍ය වන සම්පූර්ණ මුදලම 2022 වසරේදී වෙන් කිරීමට නොහැකි නම් එවැනි ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් නොකිරීමට ද වග බලා ගැනීම.
- ❖ මෙ සමඟ එවනු ලබන පෝරමය පිටපත් 03 කින් ඔබගේ යෝජනා ප්‍රමුඛතාවය අනුව ලැයිස්තු ගත කර එම ලැයිස්තු ඔක්තොම්බර් 31 දිනට පෙර ඉදිරිපත් කිරීම.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> විමධ්‍යගත ලෙස ලබා දෙන රු 4,000,000.00 විශාල මුදලක් වන බැවින් රටේ සංවර්ධනය මෙන්ම ප්‍රජාවගේ යහපත උදෙසා වියදම් කල යුතු මෙම මුදල් ඵලදායී ලෙස යෙදවීමට අනෙකුත් විමධ්‍යගත මුදල් මෙන් විවිධ ක්ෂේත්‍ර ආවරණය වන ලෙස වෙන් වෙන්ව ලබා දීමට අදාල පියවර ගැනීම සුදුසු බවට යෝජනාවක් මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන ලෙස ප්‍රකාශ කරන ලදී. එහිදී ඇතිවූ ගෝෂාකාරී තත්වය හමුවේ සිදු කල ප්‍රකාශ කිසිවක් පැහැදිළි නොවිණි.

### 05. ග්‍රාම නිළධාරී වසම් වලට වෙන් වෙන් කරන ප්‍රතිපාදන සඳහා ප්‍රමුඛතා ගත කරන ලද සංවර්ධන යෝජනා ගම සමඟ පිළිසඳරක් තුලින් ලබා ගැනීම.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ග්‍රාම නිළධාරී වසම් වලට වෙන් කරන ප්‍රතිපාදන සඳහා ප්‍රමුඛතා ගත කරන ලද සංවර්ධන යෝජනා ගම සමඟ පිළිසඳරක් තුලින් ලබා ගැනීම යටතේ මෙවර අයවැයේදී සෑම ග්‍රාම නිළධාරී වසමකම සංවර්ධන කටයුතු සඳහා රු මිලියන 3 බැගින් වෙන් කිරීමට යෝජිතය ඒ සඳහා අවශ්‍ය සංවර්ධන යෝජනා ලබා ගැනීමේ වගකීම ඔබ වෙත පැවරීමට මුදල් අමාත්‍ය හා ජනාධිපති කාර්යසාධන

බලකායේ සභාපති ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා විසින් තීරණය කර ඇත. එහිදී නිළධාරී වසම් මට්ටමින් මහජන නියෝජිතයන්ගේ, රාජ්‍ය නිළධාරීන්ගේ හා ප්‍රජාවගේ සහභාගීත්වයෙන් ගම සමඟ පිළිසඳරක් රැස්වීම තුලින් සංවර්ධන යෝජනා හඳුනාගෙන එම යෝජනා ප්‍රමුඛතා ගත කොට ප්‍රාදේශීය ආයතනයන්හී ප්‍රදේශයේ ප්‍රධානීන්ට ඉදිරිපත් කර ඔවුන්ගේ එකඟතාවය මත ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ සංවර්ධන යෝජනා වල ප්‍රමුඛතා ලේඛනයක් සකස් කර මුදල් අමාත්‍යාංශය වෙත එවිය යුතු බවට වූ ලිපිය මහ සභාවට නිවේදනය කරන ලද අතර මේ යටතේ ඉදිරිපත් වන සංවර්ධන යෝජනා පහත ක්ෂේත්‍රයන්හි ඇස්තමේන්තු ගත වියදම අනුව උපරිම බර තැබිය යුතු ප්‍රමාණයද සභාවට ඉදිරිපත් කරන ලදී.

| | | |
|---|---|---|
| ජිවනොපාය සංවර්ධනය | - | 40% |
| පොදු යටිතල පහසුකම් සංවර්ධනය | - | 40% |
| පරිසර හා තිරසර සංවර්ධනය | - | 10% |
| සමාජ සුභ සාධන හා සමාජ සංවර්ධනය | - | 10% |

**06. වාහන වෙන්දේසි කිරීමට අදාල තක්සේරු මුදල නිවේදනය කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ප්‍රාදේශීය සභාවට අයත්, 252-6483 දරණ කැබ් රථය හා NC LF 4799 දරණ මහේන්ද්‍රා කැබ් රථය ටික කාලයක සිට භාවිතා කල නොහැකි තත්වයේ පවතින බැවින් විවෘත මිළ ගණන් කැඳවා ලබා දීම සුදුසු බවට ගත් තීරණය අනුව මේ වන විට එය තක්සේරු කර වටිනාකම හඳුනාගෙන ඇති බැවින් එම වටිනාකම සභාවට නිවේදනය කරන ලද අතර ඉදිරියේදී පුවත්පතේ පල කර මිල ගණන් කැඳවා ලබා දීමට  කටයුතු කරන බව සඳහන් කරන ලදී.

| | | |
|---|---|---|
| **252-6483 දරණ කැබ් රථය** | - | **රු 1550,000.00** |
| **NC LF 4799 දරණ මහේන්ද්‍රා කැබ් රථය** | - | **රු 750,000.00** |

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> 252-6483 දරණ කැබ් රථය වෙන්දේසි කිරීමට තීරණය කල නමුත් එය භාවිතා කල හැකි තත්වයේ පවතින බවත්, වැසියේ පිපිරීම මත පමණක් අදාල වෙන්දේසි කිරීමේ තීරණය ගෙන ඇති බැවින් එය අළුත්වැඩියා කිරීමෙන් නැවත ධාවනය කල හැකි බවත්, ඉහල නියෝගයක් හෝ ගෙන අළුත්වැඩියාවක් කර ධාවනය කරන්නේ නම් වර්ථමානයේ වාහන සම්බන්ධයෙන් පවතින මිල ගණන් සළකා බැලීමේදී විශාල ලාභයක් හිමි වන බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අදාල තීරණය සම්බන්ධයෙන් තමන් ගත හැකි සෑම පියවරක්ම ගත් බවත්, රජයේ ආයතනයක් තුල ධාවනය කරන වාහනයක වැසිය අළුත්වැඩියා කල නොහැකි බවට නීතියක් පවතින බවත්, එහි වගකීම ගන්න කිසිවෙකු නොමැති බවත්, නමුත් මෙම වාහනය කන්ඩම් නොමැති බවත්, බාහිර පාර්ශවයකට මෙය අළුත්වැඩියා කොට ධාවනය කිරීමේ හැකියාව පවතින බවත්  සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> රජය මගින් භාවිතයට ගත නොහැකි යයි ප්‍රකාශ කර තිබූ ගිලන් රථ විශාල ප්‍රමාණයක් අළුත්වැඩියා කර නැවත ධාවන තත්වයට ගෙන ඇති බැවින් එහිදී සිදු කල  ක්‍රමවේදය හෝ මේ සඳහා භාවිතා කල හැකිද යන්න සභාපතිවරුන්ගේ සංගමය හරහා හෝ ඉල්ලීමක් සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> තමා එම ඉල්ලීම කිහිප වතාවක්ම සිදු කල බවත්, එසේම මීට ඉහතදී අගමැතිතුමා විසින් දැනට වරාය තුල ඇති වෙන්දේසි කිරීමට නොහැකි නීතිමය ගැටළු තිබෙන වාහන රාජ්‍ය ආයතන වලට නිදහස් කරන ලෙසට චක්‍රලේඛයක් නිකුත් කිරීම හේතුවෙන් තමන් විසින් ලිපි යොමු කර

අග්‍රාමාත්‍ය කාර්යාලයට පවා ගොස් පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතියද සහිතව වරාය වෙත යොමු කලත්, පවතින නෛතික තත්වයන් තුල එම වාහන නිදහස් කිරීමේ හැකියාවක් නොමැති බවට කරුණු ඉදිරිපත් කර ඇති බවත්, මෙවැනි අභ්‍යන්තර ගැටළු පවතින සේම අදාල කාර්යය සඳහා වැය වන කාලයද අපරාධයක් බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා මීට පෙර තමන් තාක්ෂණ කමිටුවේ සභාපති ලෙස මෙම වාහන වෙන්දේසි කිරීම සඳහා ගත් තීරණයට එහා ගොස් සභා තීරණයකට ගොස් වාහන ධාවන තත්වයට ගැනීම සුදුසු බවට නිර්දේශ ඉදිරිපත් කලත්, ඒ සම්බන්ධයෙන් කිසිවෙක් කතා නොකල බවත්, එදා එම තීරණය ගෙන ඉදිරියට යවා සුදුසු පියවරක් ගත්තා නම් මෙය ඉදිරියට සභා වත්කමක් ලෙස තබා ගැනීමේ හැකියාව පවතින නමුත් එදින ඒ සඳහා කිසිදු අවධානයක් යොමු නොකිරීම මත මෙවර තාක්ෂණ කමිටුවේදී වාහන වෙන්දේසි කිරීම සඳහා එකඟ වූ බව සඳහන් කරන ලදී.

**ඇ) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**01. ඉඩමේ තාප්පය මත අසල්වැසි නිවැසියන් කරන ඉදි කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා, ගරු මන්ත්‍රී ඩී.පි බන්දුලසේන මැතිතුමා වෙත යොමු කර තිබූ අංක 103, අනුලාදේවී මාවත, විජයපුර ලිපිනයේ පදිංචි ප්‍රේමතිලක බණ්ඩාර යන අය විසින් සිය නිවස වටා ඉදි කර ඇති තාප්ප බැම්ම මතම අසල්වැසි නිවසේ තරප්පු පෙල ඉදි කිරීම සහ නිවසේ උඩු මහල එය තාප්පය උඩම යාවන පරිදී ඉදි කිරීම හා තාප්පය බිඳ විදුලිය ලබා ගැනිම සිදු කර ඇති බවටත් මේ සම්බන්ධයෙන් මීට පෙරත් ගරු සභාපතිතුමා දැනුවත් කල බවට සඳහන් කරන ලද ලිපිය මහ සභාවට ඉදිරිපත් කරන ලද අතර ඊයේ දිනයේදී අදාල ස්ථානය පරීක්ෂා කිරීම සඳහා ලේකම් මහතා , තාක්ෂණ නිළධාරී ද සමඟ තමන්ද ගිය බවත්, එහිදී පැමිණිල්ල සිදු කරනු ලැබූ පුද්ගලයාගේ නිවසට අසල්වැසි නිවසෙහි තරප්පුව තාප්පයට සම්බන්ධ කර නොමැති නමුත් තාප්පය ආසන්නයෙන් තාප්පයට අලලා තරප්පුව ඉදි කර ඇති බවත්, දෙදෙනාගේ එකඟතාවය මත අදාල ගැටළුව නිරාකරණ කල බවත්, අදාල නෛතික තත්වයන් සම්බන්ධයෙන් දැනුවත් කල බවත්, මේ වන විට අදාල ගැටළුව නිරාකරණය වී ඇති බවත් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමී මැතිණිය,අදාල ඉදි කිරීමේ ගැටළුව වී පවතින්නේ තාප්පයක් මත ඉදි කිරීමක් සිදු කිරීම බවත්, එවැනි ඉදි කිරීම් සිදු කල හැකිද යන්න විමසන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා තාප්පයක් මත ගොඩනැගිලි ඉදි කිරීමේ හැකියාවක් නොමැති බවත්, එක් එක් ඉදි කිරීමට අදාල නෛතික තත්වය කෙසේද යන්න ඒ ඒ ඉදි කිරීම අනුව තීරණය වන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම හා ගොඩනැගිලි ඉදි කිරීම සමබන්ධව ආසන්න දිනයකදී පැවති පුහුණු වැඩමුළුවේදී යම් අවබොධයක් සහභාගී වනු ලැබූවන් වෙත ලැබෙන බවත්, එහිදී ඉදිරිපත් වූ නිර්ණායක මත අප පියවර ගත යුතු වන බවත්, ඉදිරිපත් වූ ගැටළුව විසඳා අවසන් කර තිබීම සම්බන්ධව ස්තූති වන්ත වන බවත්, සියළුම ගරු මන්ත්‍රීවරු ගොඩනැගිලි සැළසුම් අනුමත කිරීම සම්බන්ධව හේතු කාරණා අවබෝධයෙන් යුතුව කටයුතු කලානම් මෙවැනි ගැටුම් ඇති නොවන බවත්. මේ සම්බන්ධයෙන් එකිනෙකා සතු අවබෝධය විවිධාකාරයෙන් නම් අප අසාර්ථක විය හැකි බවත්, සඳහන් කරන ලදී.

**ආ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

නැත.

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම.**

<u>ගරු සභාපති එස්.බී. කුමාරදාස මැතිතුමා</u> 2021.09.09 වන දින පැවති මුදල් කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**I. ප්‍රාදේශීය සභාවට අයත් PF 7425 දරණ කැබ් රථයට අවශ්‍ය ටයර් මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභාවට අයත්, PF 7425 දරණ කැබ් රථයේ ටයර් මේ වන විට ගෙවී ඇති බැවින් එය පරීක්ෂා කර බලා අවශ්‍ය ටයර් ලබා දෙන ලෙසට එහි රියදුරු මහතා විසින් ඉල්ලීම් කර ඇති බැවින් එය මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය යටතේ අවම වශයෙන් මිල ගණන් 05 කැඳවා මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**II. කාර්යාලයේ භාවිතය සඳහා අවශ්‍ය විෂබීජ නාශක දියර මිල දී ගැනීම.**

කාර්යාලයේ භාවිතය සඳහා අවශ්‍ය විෂබීජ නාශක දියර මේ වන විට අවසන් වී ඇති බැවින් අවශ්‍ය විෂබීජ නාශක දියර ලීටර් 4 කෑන් 5 ක් මිල දී ගැනීම වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය යටතේ අවම වශයෙන් මිල ගණන් 05 කැඳවා මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**III. වාහන සේවා මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ඔයිල් ෆිල්ටර් සහ ඩීසල් ෆිල්ටර් මිල දී ගැනීම.**

ප්‍රාදේශීය සභාවට අයත් වාහන සේවා මධ්‍යස්ථානය මගින් වාහන අළුත්වැඩියාවන් සිදු කිරීමේදී අවශ්‍ය ෆිල්ටර් විටින් විට මිල දී ගැනීමේදී විවිධ දුෂ්කරතා වලට මුහුණ දෙන බැවින් එකවර එක් ට්‍රැක්ටර් රථයක් සඳහා ඔයිල් ෆිල්ටර් 03 හා ඩීසල් ෆිල්ටර් 03 ක් බැගින් ට්‍රැක්ටර් රථ 03 සඳහා ඔයිල් ෆිල්ටර් 09 හා ඩීසල් ෆිල්ටර් 09 ක් වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ මිල ගණන් 05 කැඳවා මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

**IV. අවශ්‍ය ඔයිල් සහ ඩීසල් ගබඩා කර තබා ගැනීම.**

ප්‍රාදේශීය සභාවට අයත් වාහන වල දෛනික අවශ්‍යතාවයන් වෙනුවෙන් ඒ ඒ වාහන දෛනිකව ඉන්ධන පිරවුම්හල වෙත යාමේදී මුදල් හා කාලය නාස්ති වන බැවින් අවශ්‍ය ඔයිල් හා ඩීසල් ගබඩා කර තබා ගැනීම වෙනුවෙන්, පහත සඳහන් ද්‍රව්‍ය හා උපකරණ වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ අවම වශයෙන් මිල ගණන් 05 කැඳවා මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

| | |
|---|---|
| 01. ඔයිල් 210L බැරල් | 01 |
| 02. ඩීසල් 210L බැරල් | 01 |
| 03. අවශ්‍ය කරාම (අගුළු දැමිය හැකි අඟල් 1 ප්‍රමාණයේ) | 02 |
| 04. 10 L කරඩි | 01 |
| 05. 5 L කරඩි | 01 |

## V. ජල පිරිපහදු මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය ජල කරාම අළුත් කිරීම.

ප්‍රාදේශීය සභාවට අයත් ජල පිරිපහදු මධ්‍යස්ථාන වල මේ වන විට අඟල් ½ ප්‍රමාණයේ ජල මීටර් සවි කර ඇති බැවින් එකවර පාරිභෝගික ජනතාව විශාල ප්‍රමාණයක් පැමිණ සිටීමේදී පාරිභෝගික ජනතාව මෙන්ම අදාල සේවකයාද අපහසුතාවයන්ට පත් වන බැවින් ඒ සඳහා අඟල් 1 ප්‍රමාණයේ ජල මීටර් මිල දී ගැනීම සුදුසු බවට මුදල් කමිටුවේ නිර්දේශය ලබා දෙන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.බී.ජී ගයාන් චාමර මැතිතුමා</u> 2021.09.09 වන දින මුදල් කමිටුව මගින් ලබා ගත් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අනතුරුව මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යම් විරෝධතාවක් පවතින්නේ ද යන්න විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2021 සැප්තැම්බර් මස මුදල් කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

## 02. තාක්ෂණ උපදේශණ කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

<u>ගරු සභාපති එස්.බී. කුමාරදාස මැතිතුමා</u> 2021.09.13 වන දින පැවති තාක්ෂණ උපදේශණ කමිටුව මගින් ලබා ගත් පහත සඳහන් නිර්දේශ සඳහා මහ සභා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

### 1. වාහන සේවා මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> වාහන සේවා ස්ථානය ආරම්භ කර පැවතියා වුවත්, එහි ලාභ උපයනවාද නැද්ද යන්න අවබෝධයක් නොමැති බවත්, බ්ලොග් ගල් නිෂ්පාදනය මේ වන විට ඒකක 1000 දක්වා වැඩි වී ඇති විටෙක වාහන සේවා මධ්‍යස්ථානය හා බ්ලොග් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය වෙනුවෙන් වෙන් වී ඇති ඉඩ කඩ ප්‍රමාණවත්ද යන්නත්, මෙම ස්ථාන දෙකම ඉදිරියටත් මෙම භූමියේම පවත්වාගෙන යන්නේ ද යන්නත් විමසන ලද අතර වාහන සේවා මධ්‍යස්ථානය ආරම්භ කිරීමේදී මීට වඩා සංවර්ධනයක් බලාපොරොත්තු වූ බවත්, මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා සඳහන් කල කරුණු සත්‍ය බවත්, තමන් දැනට පවතින ප්‍රගතියට වඩා දෙයක් ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී බලාපොරොත්තු වූ නමුත් අවශ්‍ය උපකරණයක් වන හයිඩ්‍රොලික් ජැක් එකක් නොමැති වීම මත අනෙකුත් පාරිභෝගික ජනතාව නොපැමිණිමේ ප්‍රවණතාවය තිබූ බවත්, පුහුණුවට යොමු කල සේවකයින් මුල් අවධිය තුල ප්‍රායෝගිකව පුහුණුව ලබා නොසිටීම මතත් යම් යම් ගැටළු මතු වූ බවත්, මේ වන විට දැනුම යම් තරමකට දියුණු කර ගත් සේවකයෙකු සිටින බැවින්, වාහන සේවා ස්ථානය යම් නිවැරදි ආදායම් ලැබීමේ අරමුණට ලඟා වෙමින් පවතින බවත්, ඉදිරියේදී ප්‍රාදේශීය සභාවට අයත්, ප්‍රධාන කැබ් රථය හැර අනෙකුත් සියළුම වාහන මෙම ස්ථානයෙන් සේවා කිරීම ආරම්භ කරන බවත්, තාක්ෂණික කමිටුව මගින් ප්‍රවර්ධනය වෙනුවෙන් අවශ්‍ය පියවර ගැනීමටද යෝජනා කර ඇති බැවින් එය ද ඉටු කිරීමට අපේක්ෂා කරන බවත්, සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> මෙම ව්‍යාපෘතිය කඩිමුඩියේ ආරම්භ කල නමුත් මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් වූ සක්‍යතා වාර්තාවක් ලබා නොගත් බවත්, ඒ තුල මෙලෙස අකාර්යක්ෂමව පවතින බවත්, මේ වන තෙක් පරිසර බලපත්‍රය ලබා ගැනීමටද පියවර ගෙන නොමැති බවත්, සේවා ස්ථානය දියුණු කිරීම වෙනුවෙන් බ්ලොගාග් ගල් නිෂ්පාදන මධ්‍යස්ථානය වෙනත් ස්ථානයක් කරා ගෙන ගොස් අවශ්‍ය ඉඩ පහසුකම් සලසා ගත යුතු බවත්, ආසන්නයේ පවතින දිවා සුරුකුම් මධ්‍යස්ථානය නිසාත්, පෙර පාසල නිසාත්, පිටවන ශබ්ධ හානිදායක නිසාත්, මෙය වෙනත් ස්ථානයක ගෙන යා යුතුම බවත්, වහා ඉක්මනින් සේවා ස්ථානය හා බහු කාර්යය ගොඩනැගිල්ල අතර කොටස වෙන් කිරීමකට යාම ද අත්‍යාවශ්‍ය බවත්, මෙම නිෂ්පාදන ආයතන 02 සඳහා ම පරිසර බලපත්‍රය ලබා ගැනීම අනිවාර්යෙන් සිදු කල යුතු බව ද ප්‍රකාශ කරන ලදී.

තවද සිය කැමැත්තෙන් යම් සේවකයෙකු සඳහා කාර්මික පුහුණුවක් දෙන්නේ නම් පූර්ණ කාලීන යාන්ත්‍රික නිළධාරී වශයෙන් තබා ගත හැකි බවත්, අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණද සැළකිය යුතු ප්‍රමාණයක් ගබඩා ගත කර ගෙන තබා ගත යුතු බවද දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා</u> වාහන සේවා මධ්‍යස්ථානය ප්‍රාදේශිය සභාවට අයත් වාහන අළුත්වැඩියා කිරීම හා සේවා කිරීම තුලින් මේ වන විට ආදායම් ලැබුවා වුවත්, එය ආදායම් වියදම් වාර්තා තුල සටහන් නොවන බවත්, එය ඉදිරියේදී අනිවාර්යෙන්ම සටහන් කිරීමට කටයුතු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරියේදී හරස් සටහන් ලැබීමක් ලෙස එම ආදායම සටහන් කිරීමට කටයුතු කරන බව සඳහන් කරන ලදී.

**2. නාච්චාදූව තොටුපල ආශ්‍රිත වාහන නැවතුම්පල පවරා ගැනීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මීට පෙරත්, මෙම ඉල්ලීම කිහිපවතාවක් සිදු කල නමුත් නැවතත් අදාල යෝජනාව ඉදිරිපත් කර තිබෙන බවත්, මේ සම්බන්ධයෙන් තමන් කිහිප අවස්ථාවකදීම ඉල්ලීම් සිදු කර ලිපි ඉදිරිපත් කලත්, ගොවි සංවිධානයේ ඉල්ලීමද සලකා බලා මදක් ප්‍රමාද කරමින් පවතින බවත්, සභාව විසින් නැවතත් එම ඉල්ලීම සිදු කරන්නේ නම් නැවතත් අදාල යෝජනාව ඉදිරි කටයුතු සඳහා ඉදිරිපත් කල හැකි බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> නාච්චාදූව ජලාශයේ පිහිටි නැවතුම්පල සම්පූර්ණයෙන් නාච්චාදූව ජලාශ රක්ෂිතයේ පවතින බවත්, දැනට වාරි මාර්ග දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියක් හරහා ගොවි සංගම් 15 ක නියෝජනය සහිත ඒකාබද්ධ ගොවි සංවිධානයට ආදායමක් හිමි වන පරිදි එම භූමිය නවීකරණය සිදු කල බවත්, අදාල භූමිය මගින් හිමි වන ආදායමින් 75% ගොවි සංවිධානය වෙතටත්, 25% ක් වාරි මාර්ග දෙපාර්තමේන්තුව වෙතටත් හිමි වන බවත්, බල ප්‍රදේශයේ ගොවි ජනතාවගෙන් සමන්විත ස්වෙච්ඡා සංවිධානයක් විසින් සිදු කරනු ලබන සුභසාධනයක් අප වෙතට බලහත්කාරයෙන් ලබා ගැනීමට උත්සහ දැරීමේදී මහ විශාල අර්බුදයකට මුහුණ දීමට සිදු වන බැවින් සාධණීය තීරණයකට එළඹිය යුතු බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස ව්‍යාපෘති වාර්ථාවක් සකස් කර ආදායම් උත්පාදනයක් පිළිබිඹු කරමින් පෞද්ගලික ධනය පවා වියදම් කරමින් චමල් රාජපක්ෂ අමාත්‍යවරයා යටතේ පැවති අමාත්‍යාංශය වෙත රැගෙන ගිය අවස්ථාවේදී එහි අමාත්‍යාංශ ලේකම් ලෙස සිටි අයිවන් සිල්වා මහතා මෙම ව්‍යාපෘතිය එම අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කල යුතු ව්‍යාපෘතියක් බවට සඳහන් කල බවත්, එම අවස්ථාවේදි ප්‍රාදේශීය සභා පනතේ ඇති නෛතික තත්වයන් මත විනෝදය සඳහා දිය කෙලීම වෙනුවෙන් ගාස්තු අය කිරීමේ අයිතිය සභාව සතුව පවතින බව සඳහන් කරමින් එතුමා සමඟ අදහස් හුවමාරු කර ගත් බවත්, සඳහන් කරන ලදී.

අනතුරුව ප්‍රදේශිය සභා පනත ප්‍රකාරව මෙහි අදායම් ලබා ගැනීම ප්‍රාදේශිය සභාවට අයත් බැවින් මේ වන විට එම ස්ථානයේ සිදු වන අක්‍රමිකතාවය වලක්වා ලමින් අප බලාපොරොත්තු වූ පරිදී දැනට පවතින තත්වයට වඩා විදිමත්ව, අලංකාරව සකස් කර පිටස්තර පුද්ගලයන්ගෙන් ගාස්තු අයකර විනෝදය සඳහා මෙන්ම නැරඹුම් ස්ථානයක් ලෙස වැඩි දියුණු කර සභාවට ආදායම් උත්පාදනය කිරීමේ අරමුණ ඉදිරියට ගෙන යාමට සභාවක් ලෙස එක්වී කටයුතු කරන ලෙස දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරමින් නැගෙනහිර නුවරගම් පළාත් ප්‍රාදේශීය සභාව ලංකාවේ සියළු ජනී ජනයා අතර ප්‍රසිද්ධියට පත් වන ව්‍යාපෘතියක් ලෙස එදා රජවරුන් සෑදූ නාච්චාදූව ජලාශ්‍රය නැතහොත් නටන දූපත රම්‍ය ස්ථානයක් බවට පත් කිරීමට කටයුතු කරමුයි යන්නත්, ඒ සම්බන්ධ යෝජනාවක් ගෙන ඒම වෙනුවෙන් ස්තූති වන්ත වෙමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මේ සම්බන්ධයෙන් තමන් නැවතත් ඉදිරි පියවර ගැනීමට කටයුතු කරන බවත්, මෙය ගරු ආණ්ඩුකාරතුමා හරහා ඉල්ලීම් කිරීම පෙරට වඩා සුදුසු වේ යයි අදහස් කරන බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කරන බව සඳහන් කරන ලදී.

3. **ත්‍රී රෝද රථ ගාල් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ පවත්වාගෙන යන බැවින් එයින් ලැබෙන ආදායමෙන් 50% ප්‍රමාණයක් සභාවට ලබා ගත හැකි නිසා ඒ සඳහා සභා යෝජනාවක් ලබා ගැනීමටත්, එසේ නොමැතිව සම්පූර්ණ ආදායම ලබා ගැනීමට අවශ්‍යනම් බල ප්‍රදේශයේ පවතින රථගාල් ස්ථාපිත කල හැකි ස්ථාන සම්බන්ධ නාම ලේඛනයක් සභාවට ඉදිරිපත් කිරීමට ගරු සභිකවරුන් වෙතින් ඉල්ලා සිටීම සුදුසු බවට වූ නිර්දේශය**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ඉදිරිපත් කල නිර්දේශය තුල වඩාත් සුදුසු වන්නේ අපේ ආදායම අපම උපයා ගැනීම වන බැවින් ගරු මන්ත්‍රීවරුන්ගේ ද අපකාර අරගෙන ත්‍රී රෝද රථ ගාල් පවත්වාගෙන යන ස්ථාන වලින් ගාස්තු අය කිරීමේ කාර්යය ආරම්භ කල යුතු බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> සභාව මගින් පවත්වාගෙන යනු ලබන කමිටු තුල නීති රීති අනපනත් සම්බන්ධ නිවැරදි දැනුමකින් යුක්ත විය යුතු බව සඳහන් කරන ලද අතර තාක්ෂණ කමිටු වාර්ථාවේ ගරු සභාපතිතුමා කමිටුවට සහභාගී වී ඇති බවට සඳහන් කර ඇතත්, වාර්ථාව තුල ගරු සභාපතිතුමා පිළිගැනීම සිදු කර නොමැති බවත්, එය වාර්ථාවේ පවතින අඩු පාඩුවක් බවත් සඳහන් කරන ලදී.

තවද පළාත් සභාව ට කිසි ලෙසකින් වත් සභාව සතු ත්‍රී රෝද රථ ගාල් පවරාගෙන නොමැති බවත්, නීතිඥ ප්‍රේමසිරි හෙට්ටිආරච්චි මහතාගේ උපදෙස් මත පළාත් සභාව විසින් සකස් කල ප්‍රඥප්තියක් මගින් මගී ප්‍රවාහන සේවාව වෙනුවෙන් ගාස්තුවක් අය කිරීමට කටයුතු කල බවත්, නැවතුම්පොළ වල් කිසි ලෙසකින්වත් පළාත් සභාවට හිමි නොවන බවත්, එහි මුදලක් අය කිරීමේ බලය සභාව සතුව පවතින බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

මේ සඳහා අප සභාවක් ලෙස සිදු කල යුතු වන්නේ, අනුරාධපුර පොලිසිය හා හිදෝගම පොලිසිය සමඟ එක්වී මේ පිළිබඳ දැනුවත් කර අදාල ත්‍රී රෝද රථ රියදුරන් සඳහා යම් ස්ටිකරයක් ලබා දී ලියාපදිංචිය සිදු කර ගැනීම බවද සඳහන් කරමින් මේ සඳහා මහජන නියෝජිතයන්ගේ සහයෝගයද ලබා ගෙන ක්‍රමවත් කිරීමකට යාම සුදුසු බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> බල ප්‍රදේශයේ මේ  වන විට ලියාපදිංචි ත්‍රී රෝද රථ ගාල් නැතිද යන්න විමසන ලද අතර ප්‍රාදේශීය සභාව විසින් ත්‍රී රෝද රථ ගාල් ස්ථාපිත කරන්නේ නම් ඒ සඳහා ප්‍රථමයෙන්ම එම ස්ථාන වලට අවශ්‍ය යටිතල පහසුකම් සපුරාලිය යුතු බවත්, එහිදී වීථි පහන් සවි කර දීම ආදිය කෙරේද අවධානය යොමු කල යුතු බව සඳහන් කරන ලදී. එසේ නොහැකිනම් එය ක්‍රියාත්මක නොකරන ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> මේ වන විට එලෙස ලැයිස්තුවක් හෝ විෂයක් හෝ ආදායමක් හෝ නොමැති බවත්, ත්‍රී රෝද රථ ගාල් පවත්වාගෙන යන්නේ නම් ඒ  සඳහා නිශ්චිත භූමියක් නොමැති බවත්, මාර්ග රක්ෂිතය තුල මෙම ස්ථාන ස්ථාපිත කර ඇති බවත්,  යටිතල පහසුකම් සපුරාලනවා යන්න සඳහන් කලත්, ඒ තුල ලබා දිය හැකි වන්නේ, නාම පුවරුවක් සවි කර දීම පමණක් විය හැකි බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> ත්‍රිරෝද රථයක් ලියාපදිංචි කිරීම තුල නැවතුම්පලේ සිටින ත්‍රී රෝද රථ හිමියන්ට යහපතක් මිස අයහපතක් සිදු නොවන බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී

4. **කොට්ඨාශය තුල පවතින ඒ ඒ  වීථි පහන් සම්බන්ධයෙන්  වගකීම පැවරිය හැකි පුද්ගලයින් සිටින  ස්ථාන වලට අමතරව එසේ වගකීමක් පැවරිය නොහැකි නමුත් වන අලි තර්ජනය නිසා හා අනෙකුත් අත්‍යාවශ්‍යතා මත වීථි පහන් අත්‍යාවශ්‍ය ස්ථාන සඳහා මේ වන විට වෙළඳපලේ පවතින LDR බල්බ හෝ Sola Light හඳුන්වා දීම සුදුසු බවටත්, බල ප්‍රදේශයේ වීථි ලාම්පු අත්‍යාවශ්‍ය නැති ස්ථාන වලින් එම පහන් ඉවත් කිරීම සඳහා ඊට අදාල ලැයිස්තුවක් ගරු සභිකවරුන් වෙතින් ලබා ගැනීම සුදුසු බවටත් වූ  නිර්දේශය**

ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා මෙම යෝජනාව සම්බන්ධයෙන් අප වඩා හොඳ අවධානයක් යොමු කල යුතු බවත්, අලි තර්ජනය සහිත ප්‍රදේශ වල සවි කර ඇති වීථි ලාම්පු ජන ගහනය අවම ස්ථාන වල සවි කර ඇති බැවින් දැල්වීමේ හා නිවීමේ ගැටළු මතු වන බැවින් මෙම ආදේශක බල්බ යෝජනා කල බවත්, බල ප්‍රදේශයේ ඇතැම් ස්ථාන තුල අත්‍යාවශ්‍ය නොවන නමුත් වීථි පහන් සවි කර තිබෙන බැවින් ඒවා ඉවත් කර සුදුසු ස්ථාන වල ස්ථාපිත කිරීමද සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා බල ප්‍රදේශයේ වීථි ලාම්පු අත්‍යාවශ්‍ය නැති ස්ථාන වලින් එම පහන් ඉවත් කිරීම සඳහා ඊට අදාල ලැයිස්තුවක් ගරු සභිකවරුන් වෙතින් ලබා ගැනීම සුදුසු බවට වූ නිර්දේශය තුල තාක්ෂණ කමිටුවේ සමාජිකයෙකු සහභාගීත්වය සඳහා යොමු කරන ලෙස සඳහන් කරන ලද අතර එසේ නොමැති වුවහොත් ඒ සම්බන්ධයෙන් ගැටළු මතු විය හැකි බව ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මෙම යෝජනාව තුලට සෙන්සර් බල්බ මිල දී ගැනිම සඳහා වූ සංශෝධනයද ඇතුලත් කරන ලෙසත්, ඉහතින් සඳහන් කල තුලානයකට රු 3000,000.00 දක්වා වෙන්කිරීමේ ව්‍යාපෘතිය තුල අවශ්‍ය ස්ථාන සඳහා Sola Light හඳුන්වා දීමේ යෝජනාව ඇතුලත් කර ඇති බව ද සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා ඊයේ දිනයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර සැළසුම් නිළදාරිවරයාගේද සහභාගීත්වයෙන් තම කොට්ඨාශයේ තුලාන 03 හිම ග්‍රාමීය කමිටු රැස්වීම් පැවැත් වූ බවත්, එහිදී හිමි වී ඇති 300,000 ක සුභ සාධනය වෙනුවෙන් වෙන් කර ඇති මුදලින් තම කොට්ඨාශයම ආවරණය වන පරිදී Sola Light සිවි කිරීමට නම් කළ බවත්, එලෙස සෑම කොට්ඨාශයකම සුභ සාධනය වෙනුවෙන් වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයෙන් Sola Light සවි කිරීමට යොදා ගැනීම සුදුසු බවට යෝජනා කරන ලදී.

5. **බ්ලොග් ගල් නිෂ්පාදනය කිරීම සඳහා වූ නව බ්ලොග් ගල් යන්ත්‍රය නෙළුබැව පද්මගිරි රජමහ විහාරය ඉදිරිපිට ඉදි කර ඇති පොළ භූමිය තුල ස්ථාපිත කිරීම සුදුසු බවටත්, ඉදිරියේදී ඒ තුල වැසිකිළි වළලු, කොන්ක්‍රීට් කණු හා හියුම් පයිප්පද, කුට්ටි ගල්ද සකස් කිරීම සුදුසු බවට වූ නිර්දේශය.**

ගරු මන්ත්‍රී ආර්. එම් කුමාරසිංහ මැතිතුමා කුඩා නෙළුබැව පොල භූමිය ප්‍රාදේශීය ලේකම කාර්යාලය විසින් සභාවට පවරා දී නොමැති බවට සඳහන් කර තිබූ බවත්. මෙම ස්ථානයේ කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට යෝජිත බවටත් සඳහන් කර තිබූ බවත් මෙම බ්ලොග් ගල් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට යන අවස්ථාවේදී, අයිතිය සම්බන්ධයෙන් ගැටළුවක් පවතින්නේ නැතිද යන්න විමසන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාල භූමිය ප්‍රාදේශීය සභාවට පවරා තිබෙන බවත්, කොම්පොස්ට් ව්‍යාපෘතිය මේ වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමක් පෙන්නුම් නොකරන සේම අවට ජනතාවගේ හා පන්සලේ ලොකු හාමුදුරුවන්ගේ විරෝධතාවයක් මත තරමක පසුබෑමකට ලක් වී ඇති බවත්, දැනට බ්ලොග් ගල් ව්‍යාපෘතිය ආරම්භ කරගෙන යාමට කටයුතු කරන බව සඳහන් කරන ලදී.

6. **බල ප්‍රදේශය තුල තව දුරටත් සංවර්ධනය කල යුතු හා ඉදි කල යුතු පාලම් පිළිබඳ විස්තරයක් හා සංවර්ධනය කර දෙන ලෙසට වූ ඉල්ලීමක් අදාල අමාත්‍යවරයා වෙත යොමු කිරීමට වූ නිර්දේශය**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා බල ප්‍රදේශයේ පාලම් ඉදි කල යුතු ස්ථාන පවතින්නේ නම් එම ඉල්ලීම් අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීමේ හැකියාව පවතින බැවින් සියළුම ගරු මන්ත්‍රීතුමන්ලා අදාල ඉල්ලීම් සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා නාච්චාදූව 259 තුලානයේ 5 ඇල නාග විහාරය හරහා මල්වතු ඔය ඔස්සේ, පාලමක අවශ්‍යතාවය කියා නිම කල නොහැකි බවත්, නගර සභාවයි ,ප්‍රාදේශීය සභාවයි යා වන ඉතාම උචිතම ස්ථානය මෙය වන බවත්, එම ඉල්ලීම ඉදිරි කටයුතු සඳහා යොමු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

**7. බල ප්‍රදේශයේ කෘෂිකර්මාන්තය සඳහා අවශ්‍ය රසායනික පොහොර වෙනුවෙන් ආදේශකයක් ලෙස තම වගා කටයුතු සඳහා අවශ්‍යතාවයට සරිලන පරිදි කාබනික පොහොර නිෂ්පාදනය හා බල ප්‍රදේශයේ සියළුම ගෘහ ඒකක වලින් ජනනය වන කසල බාහිර පරිසරයට මුදා හැරීම අවම කර එම කසල කාබනික පොහොර බවට පත් කිරීම හා එම නිෂ්පාදන අලෙවි කිරීම සඳහා තරියන්කුලම ග්‍රාමයේ කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ස්ථාපිත කිරීමට නියමිත බැවින් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සුදුසු බවටත්, දියර පොහොර නිෂ්පාදනය පිළිබඳ පුහුණුවක් සුදුසු සේවකයෙකු වෙත හා අදාල විෂය නිලධාරීයා වෙත ලබා දීම සුදුසු බවට වූ නිර්දේශය**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> තරියන්කුලම පරිහරණය නොකරන ක්‍රිඩා පිටියක් ලෙස වෙන්කර තිබූ නමුත් මේ වන විට කැළය වැවී ඇති භූමිය සභාවේ වත්කමක් ලෙස සංවර්ධනය කර දියර පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට මෙලෙස යෝජනා කරන බව සඳහන් කරන ලදී.

<u>ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා</u> ඉතාමත් කාලෝචිත යෝජනාවක් බවත්, රජය මගින් ගෙන යන වැඩසටහන යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම බල ප්‍රදේශයේ ගොවි ජනතාව වෙනුවෙන් ඉතාමත් සුදුසු බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය</u> රටේ ජනතාව පෙලෙන රෝග රැසකට හේතුව වී පවතින රසායනික පොහොර භාවිතය නවතාලමින් කාබනික පොහොර නිෂ්පාදනය කිරීම හෙවත්, කොම්පොස්ට් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන අතර භූමිය සකස් කිරීමේදී මෙම පොහොර අවශ්‍යතාවය පැන නැගුණත් පැලය වර්ධනය වීමත් සමඟ හට ගන්නා රෝග සඳහා මෙන්ම වර්ධනය සඳහා දියර පොහොර භාවිතයට ගන්නා සේම එය ඉතාමත් සාර්ථක ක්‍රමවේදයක් වන බවත්, මෙම දියර පොහොර නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභාව අවධානය යොමු කිරීම සම්බන්ධයෙන් සතුටු වන සේම තාක්ෂණ කමිටුවේදී ඒ පිළිබඳව වූ යෝජනාව ඉදිරිපත් කර අවශ්‍ය නිර්දේශ ලබා ගැනීම වෙනුවෙන් කමිටුවේ සභාපති ගරු උප සභාපතිතුමාට ස්තූති වන්ත වන බවත්, සඳහන් කරමින් දියර පොහොර නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් වන යෝජනාවට එකඟතාවය ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> පිළිසරු ව්‍යාපෘතිය යටතේ ආරම්භ කර පවත්වාගෙන යන කීරික්කුලම කොම්පෝස්ට් ව්‍යාපෘතිය නගර සභාවෙන් ක්‍රියාත්මක කර තිබියදී මීට පෙර ලබා දී මේ වන විට නතර කර ඇති මාසික කුලිය ලබා ගැනීමට වූ කාර්යයේ ප්‍රගතිය කෙසේද යන්නත්, රජයේ නව පොහොර නිෂ්පාදන වැඩසටහන යටතේ මෙම බල ප්‍රදේයේ කොපමණ ව්‍යාපෘති සංඛ්‍යාවක් ක්‍රියාත්මක වන්නේ ද යන්නත් විමසන ලදී.

තවද රසායනික පොහොර මහ බිල්ලෙකු ලෙසට සමාජ ගත කිරීමට උත්සහ දැරුවද 100%කාබනික පොහොර භාවිතා කරනු ලබන රටවල් ලෝකයේ නොමැති බවත්, කොම්පොස්ට් පොහොර භාවිතය පමණක් සිදු කිරීම සඳහා ප්‍රකාශ කර තිබුනත් ගොවියන්ට ඒ පිළිබඳ දැනුමක් හෝ අවබෝධයක් නොමැති වීම තුල ගොවියෝ වගා කටයුතු සිදු කරනවාද නැද්ද යන අවිනිෂ්චිත තාවයක සිටින බවත්, ආණ්ඩුව විසින් කොම්පෝස්ට් පොහොර ආනයනය කරන බවට සඳහන් කලත් එහි සාම්පල් පරීක්ෂාවේදී ශාක පද්ධතියට හානි කරන දෑ එහි අඩංගු බවට සඳහන් කර ඇති බවත්, ප්‍රායෝගික වශයෙන් ගොවීන්ට වන අපහසුතාවය වලකාලමින්, ක්‍රම ක්‍රමයෙන අදාල කාබනික පොහොර හඳුන්වාදෙන ලෙසත් නව බීජ සඳහා වන පොහොර අවශ්‍යතාවය මෙලෙස සම්පූර්ණ කළ නොහැකි බැවින් ගොවියන්ගේ අවශ්‍යතාවය වෙනුවෙන් අවශ්‍ය පොහොර සැපයීම සඳහා සභාව මැදිහත් වීම අනිවාර්යෙන් සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා 1948 පසුව රට තුල ක්‍රියාත්මක වන හොඳම යෝජනාවක් ලෙස කාබනික පොහොර භාවිතය හා හරිත රාජ්‍යයක් ඇති කිරීමේ සංකල්පය හැඳින්විය හැකි බවත් මේ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා වෙත හා අග්‍රාමාත්‍ය තුමා වෙත ස්තූතිවන්ත වන බවත්, මෙය අනාගත පරම්පරාව වෙනුවෙන් ගනු ලැබූ පියවරක් බවත් මේ සම්බන්ධයෙන් විවිධ අර්ථකථන ගෙන ආවත් මේ වන විට සෑම නිවසකම කොම්පෝස්ට් වලක් සකස් කර කොම්පෝස්ට් නිෂ්පාදනෙය් නිරත වෙමින් ඒ අවශ්‍යතාවය සපුරා ගන්නා බවත්, මේ සඳහා දිරි දීමනා ලබා දීමට රජය විසින් ප්‍රතිපාදන වෙන් කර ඇති බවත්, අතිගරු ජනාධිපතිතුමා එවකට ආරක්ෂක ලේකම් ව සිටිය දී කොම්පෝස්ට් ව්‍යාපෘතිය 2011 වසරේදී ආරම්භ කළ බවත් සඳහන් කරන ලදී.

තවද රට තුළට පොහොර ආනයනය කිරීමේ දී නිසි ප්‍රමිතිය පරීක්ෂාවක් සිදු කරන බවත් ආනයනය කරනු ලබන පොහොර ප්‍රමාණයක් අඩු කරමින් රට තුළ කොම්පෝස්ට් නිෂ්පාදනය කර ගැනීමේ හැකියාව පවතින්නේ නම් අපි ජයග්‍රහණය කළා වන බවත්, ගොවීන් මෙම නිෂ්පාදන කාර්යය ආරම්භ කර තිබෙන බවත් 1971 වර්ෂයට පෙර අප කිසිදු රසායනික පොහොරක් භාවිතා නොකළ නමුත් මේ වන විට ඒ සියල්ල අමතක වූ ලෙස රසායනික පොහොර වල අවශ්‍යතාවය හුවාදැක්වීම කොපමණ වැරදි සහගත ද යන්නත් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අප සියළු දෙනා මැදිහත් වන්නේ නම් මෙය වඩාත් සාර්ථක වන බවත්, 1977 පැවති දේශීය බීජ බැහැර කර නව බීජ හඳුන්වා දුන් නමුත් නැවතත් දේශීය දේ කෙරේ අවධානය යොමු වෙමින් පවතින බවත් මෙවැනි සාර්ථක ක්‍රම අනුගමනය කරමින් පවතිද්දී රජය මගින් කරගෙන යනු ලබන කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘති සම්බන්ධයෙන් ධනාත්මකව සිතන ලෙස ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා දියර පොහොර නිෂ්පාදනය සම්බන්ධයෙන් සභාව මැදිහත්වී සිදුකරගෙන යනු ලබන වැඩසටහන තුළ කෙටිකාලීන , දිගුකාලීන හා මධ්‍ය කාලීන වශයෙන් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව ව්‍යාපෘති වාර්තාවක් සභාවට ඉදිරිපත් නොවූ බවත් දියර පොහොර නිෂ්පාදනය සම්බන්ධයෙන් අමුද්‍රව්‍ය හා තාක්ෂණය යොදා ගන්නේ කෙසේද යන්න පිළිබඳව ද සඳහන් වී නොමැති බවත් මහජන මුදල් වියදම් කරමින් මෙලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළ බලාපොරොත්තු වූ ආදායම උත්පාදනය කර ගැනීමේ හැකියාවක් නොමැති වුවහොත් අත් වන ඉරණම කෙසේද යන්නත් ප්‍රකාශ කරන ලදී.

තවද මීට පෙර අප සතුව පැවති කීරික්කුලම කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ආදායමත්, බොරළු වලේ ආදායමත් නතර කර ගනිමින් දීර්ඝ කාලීන ආදායම් සොයා මෙලෙස වෙහෙස වන බවත් ඒ පිළිබඳ අධ්‍යයනය කළ යුතු වන්නේ නැද්ද යන්නත් විමසන ලදී.

තව ද කෘෂිකර්මාන්තය නගා සිටුවීමට කාබනික පොහොර සමග හැකි වන බවට ප්‍රකාශ කළත් ඉදිරියේදී රටේ නිශ්පාදනයෙන් 30% ක්වත්, මෙම පොහොර යෙදීම මගින් අත්පත් කර ගැනීමට නොහැකි වනු ඇති බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලද අතර ලෝක ආර්ථිකය හා ගැටීම සඳහා රසායනික පොහොර හඳුන්වා දුන් බවත්, එහි අරමුණු ඉක්මන් අස්වැන්නක් ලබා ගැනීම හා රටේ අවශ්‍යතාවයන් සපුරා ගැනීම බවත් සඳහන් කරන ලද අතර එළවළු කෙටි කාලීන බෝග වන බැවින් කාබනික පොහොර කියන දීර්ඝ කාලීන විකල්පයකට එහි වර්ධන අවශ්‍යතාවය සපුරාලිය නොහැකි වන සේම ආර්ථික වගාවක් ලෙස භාවිතා කිරීමේ හැකියාව ද නොමැති වී යන බව දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත දියර පොහොර නිෂ්පාදනය මඟින් ආදායම් උත්පාදනය අරමුණු කර ගන්නවාද, ගොවීන් සඳහා ආදර්ශයක් සැපයීම සිදුකරනවාද යන්න පිළිබඳව පැහැදිලිව වෙන් කර ගත යුතු බවත්, මෙම ව්‍යාපෘතිය ජනතාවට සේවය සැපයීම අරමුණින් ක්‍රියාත්මක කල යුතු බවත්, මේ සඳහා ජාත්‍යන්තර වශයෙන් පවා වැදගත් වෙන ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා සම්බන්ධ කරගනිමින් සහයෝගය ලබාගැනීම අනිවාර්යෙන්ම සිදු කළ යුතු බවත්,එතුලින් අනාගත දැක්මක් සහිතව සාර්ථක ව්‍යාපෘතියක් අත්පත් කර ගැනීමේ හැකියාව ප්‍රාදේශීය සභාවට හිමිවන බවත් සඳහන් කරන ලදී.

තවද පාම් පිටි කනවාට වඩා තිරිඟු පිටි කෑම හොඳයි යන්න සඳහන් කළත්, තිරිඟු පිටි ආහාරයට ගන්නේ කෙසේද යන්න දන්නේ නැතිනම් එයින් පලක් නොවන්නා සේම කොම්පෝස්ට් භාවිතය ද නිසි තාක්ෂණය පුහුණුව හා උපදෙස් ලබා දී කල් වේලා ඇතුව හඳුන්වා දීම සිදු කලානම් මෙය මීට වඩා සාර්ථකත්වයක් පෙන්නුම් කරන බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා කෙසේ වෙතත් ප්‍රාදේශීය සභාව මගින් ක්‍රියාත්මක කිරීමට යන මෙම ව්‍යාපෘතිය ජාතික වශයෙන් හා ආර්ථිකමය වශයෙන් භාවිතයට ගැනීමට ගරු සභාපතිතුමාට විශාල වගකීමක් තිබෙනු ඇති බවත්, මෙතුලින් සභා අරමුදල් අපතේ යාමක් සිදුවන්නේ නම් ඒ සම්බන්ධයෙන් නිළධාරීන්ද වගකීම දැරිය යුතු වන බවත් එලෙස අපේක්ෂා කළ ආදායමක් හෝ සංවර්ධනයක් සිදු නොවූ ව්‍යාපෘති කිහිපයක්ම සභාව විසින් ක්‍රියාත්මක කල බවත්, මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් නිවැරදි යෙදවුම් , නිමවුම් , පවතින ශක්තීන් දුර්වලතා යනාදි සියල්ල ඇතුලත් නිවැරදි ව්‍යාපෘති වාර්ථාවක් සකස් කර ඒ අනුව ක්‍රියාත්මක කරන ලෙසත්, මෙය ආදායම් උත්පාදනය සේම ජනතාවට සේවය සැපයිය හැකි ව්‍යාපෘතියක් ලෙස පුහුණු සේවකයින් හා අවශ්‍ය සේවක පිරිස් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ප්‍රථමයෙන්ම නම් කර තබා ගත යුතු බවත්, මේ සඳහා අනිවාර්යෙන්ම ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමාගේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කරන ලෙසත් නියමු ව්‍යාපෘතියක් ලෙස ප්‍රජාවට හා ගොවීන්ට ආදර්ශයක් ලබා දීමට කටයුතු කරමුයි යන්නත් ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා</u> අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ජාතික වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරනු ලබන කාබනික පොහොර සිය රටේම නිෂ්පාදනය කරමින් වකුගඩු රෝගීන්, පිළිකා රෝගීන් අවම කර ගනිමින් සෞඛ්‍යමත් රටක් ඇති කිරීමේ බලාපොරොත්තුවෙන් ආරම්භ කල වැඩසටහන සඳහා ප්‍රාදේශීය සභාව ශක්තියක් වීම උදෙසා ආරම්භ කිරීමට තාක්ෂණ කමිටුව හරහා ඉදිරිපත් කල දියර පෙහොර නිෂ්පාදන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් බෙහෙවින් ස්තූතිවන්ත වන බවත්, මේ වන විට උතුරු මැද පළාත තුල ගරු ඉඩම් අමාත්‍ය එස්.එම් චන්ද්‍රසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ LRC පොහොර නමින් මේ වන විට නියමු ව්‍යාපෘති 35 ක් ක්‍රියාත්මක වන බවත්, ඒ තුලින් පොහාර ටොන් 03 ක් රටට ලබා දීමට අපේක්ෂා කරන බවත්, සඳහන් කරන ලදී.

තවද ගොවි ජන සේවා මධ්‍යස්ථානයේ කෘෂිකර්ම පර්යේෂණ නිළධාරී හරහා ග්‍රාමීය මට්ටමින් සැළකිය යුතු ප්‍රමාණයක් කණ්ඩායම් සමිති හරහා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයේ නිරත වන බවත්, ගොවීන් ලවා සිය අවශ්‍යතාවය වෙනුවෙන් පොහොර නිෂ්පාදනය ආරම්භ කර ගෙන යන බවත්, රටේ ප්‍රසිද්ධ පොහොර සමාගම් කිහිපයක් ග්‍රාමීය මට්ටමේ ගොවීන්ගේ උපකාරය සහිතව මාකඳුරේ , ගන්නෝරුව , මහ ඉළුප්පල්ලම කාබනික පොහොර පර්යේෂණ ආයතන වල අධීක්ෂණය හරහා කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනයේ යෙදෙන බවත්, ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා රටට පමණක් නොව මුළු ලෝකයටම කාබනික පොහොර වල හැකියාව පෙන්වා තිබෙන අවස්ථාවක එතුමාගේද සහය ඇතිව ප්‍රාදේශීය සභාවේ පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය ආරම්භ කිරීම වඩා සුදුසු බවත්, ඒ සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේද අදහස් ප්‍රයෝජනයට ගෙන විශේෂඥ දැනුම සහිත පුද්ගලයින්ගේද දැනුම හා උපදෙස් රැගෙන ග්‍රාමීය කසල සඳහාද විසඳුමක් සපයමින් සාර්ථක ව්‍යාපෘතියක් ලෙස අඩුපාඩුද හඳුනා ගනිමින් ක්‍රියාත්මක කිරීම සුදුසු බව ප්‍රකාශ කරමින් සිය අදහස් දැක්වීම අවසන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා</u> මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමේදී අවශ්‍ය වන සතත්ව අපද්‍රව්‍ය මේ වන විට ඉතා ඉක්මනින් මිල වැඩි වී ඇති බවත්, ඒවා සපයා ගන්නේ කෙසේද යන්න වැඩපිළිවෙලක් හා ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අනෙකුත් අමුද්‍රව්‍ය සපයා ගන්නේ කෙසේද යන්න සැළසුම මුලින්ම සකස් කල යුතු බව සඳහන් කරන ලදී.

අනතුරුව රටේ පවතින වකුගඩු රෝගය රසායනික පොහොර හේතුවෙන් ඇති වන බවට කිසි දිනෙක තහවුරු කර නොමැති බවත්, අනුරාධපුර දිස්ත්‍රික්කයේ යල මහ කන්න දෙකම ගොවිතැන් කටයුතු කරන ප්‍රදේශ වල ජනතාවට වඩා අනෙක් ප්‍රදේශ වල ජනතාව වකුගඩු රෝගයෙන් පෙළෙන බවට පෙන්නුම් කරන බවත්, එම රෝගය බිල්ලෙකු වශයෙන් පෙන්වා කාබනික පොහොර හඳුන්වා දෙන නමුත් ඒ සඳහා තමන් විරුද්ධ වන බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රී කේ.හැරිසෙන්ස් මැතිතුමා පිළිබඳ තමන් දැඩි සේ කණගාටු වන බවත්, පසුගිය ඉතිහාසය තුල ජනතා විමුක්ති පෙරමුණ රජය මේ පළිබඳ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට පෙර සිටම රට කාබනික පොහොර නිෂ්පාදනයට යා යුතු බවට අදහස මුල් බැස ගෙන කටයුතු කල පිරිසක් වූවත්, එතුමන්ලාම මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් එකඳු වචනයක් හෝ විරුද්ධ වනවානම් ඒ සම්බන්ධයෙන් බෙහෙවින්ම කණගාටු වන බවත්, මෙම ව්‍යාපෘතිය සඳහා විවිධ ක්ෂේත්‍ර වල දැනුම සහිත පුද්ගලයින් ඒකරාශි කරගෙන කටයුතු කරන බවත්, සඳහන් කරන ලදී.

තවද ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා සඳහන් කල පරිදි තමන් සභාපතිධූරය දැරූ පසු ඇතැම් ව්‍යාපෘති ආරම්භ කලත් ඒ සඳහා ව්‍යාපෘති වාර්ෙතාවක් හෝ සක්‍යතා අධ්‍යයනයක් සිදු නොකල බව පිළිගන්නා බවත්, එසේ හෝ එම ව්‍යාපෘති ආරම්භ නොකලා නම් මේ වන විටත් කිසිදු ව්‍යාපෘතියක් ආරම්භ කර නොමැති බවත්, තමන් වෙත ලැබී තිබෙන වසර 4 කාලය තුල ආරම්භ කල ව්‍යාපෘති තුලින් අපේක්ෂිත සාර්ථකත්වය නොලැබුවා වූවත්, ඉදිරියේදී අනිවාර්යෙන්ම සාර්ථක වනු ඇති බවත්, තමන් ඊට අදාල මූලික අඩියර මෙලෙස ආරම්භ කල බවත්, තමා ඒ පිළිබඳ සතුටු වන බවත්, සඳහන් කරන ලදී.

මේ වන විට වාහන සේවා මධ්‍යස්ථානය ආරම්භ කිරීම තුල සභාවට අයත් වාහන සේවා කිරීම මේ වන විට ආරම්භ කරගෙන යන බවත්, ආර්ථික මධ්‍යස්ථානය මේ වන විට වසා දමා තැබුවා වූවත්, ඉදිරියේදී අදාල මධ්‍යස්ථානය ටෙන්ඩර් කර ලබා දීමට අපේක්ෂා කරන බවත්, එම ස්ථානයේ ඉදිරියේදී LDSP ව්‍යාපෘතිය යටතේ කඩ කාමර 08 ක් ඉදි කිරීමට කටයුතු කර ගෙන යන බවත්, ඒ සඳහා සක්‍යතා වාර්ථා , ව්‍යාපෘති වාර්ථා සකස් කර අනුමත කරගෙන මෙම කාර්යයන් සිදු කිරීමට කටයුතු කලානම් මෙම ව්‍යාපෘති කිසිවක් නොමැති බවත්, එතැනින් නොනැවතී බල ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය වෙනුවෙන් සහන මිලට ජලය ලබා දීම සඳහා ජල ව්‍යාපෘති ආරම්භ කල බවත්, කුඩා බ්ලොග් ගල් යන්ත්‍රයක් මගින් සේවකයින් දෙදෙනෙකු යොදවාගෙන බ්ලොග් ගල් නිෂ්පාදනය ආරම්භ කල බවත්, එතුලින් සේවකයින් වැඩක් සඳහා යොදවා ඔවුන්ගේ වැටුප හෝ ආවරණය කර ගැනීමට කටයුතු කල බවත්, වර්ථමානය වන විට කඩ බදු ආදායම අහිමි වී ගොස් ඇති මොහොතක පවා සේවක වැටුප් ගෙවා දෛනික වියදම් දරමින් සාර්ථකව ඉදිරියට යන බවත්, එයට හේතුව තමා විසින් ආරම්භ කල ව්‍යාපෘති හේතුවෙන් බව දීර්ඝ ලෙස කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද කීරික්කුලම කොම්පෝස්ට් ව්‍යාපෘතිය මගින් මාසිකව ගෙවා ගෙන ආ රු 300,000 මුදල මෙතෙක් හිමි නොවන බවත්, මේ සම්බන්ධයෙන් සිදු කල සාකච්ඡා තුලින් අදාල ගාස්තු ගෙවීමට තීරණය කලත් නගර සභාව මේ වන විට මුහුණ දී ඇති මුදල් අර්බුදය හේතුවෙන් සේවක වැටුප් හෝ ගෙවීමට නොහැකි වීම මත අප වෙත හිමි වීමට තිබෙන මුදල ගෙවීමේ අපහසුතාවය දක්වා ඇති බවත්, සඳහන් කරන ලදී.

තවද ග්‍රාමීය මට්ටමින් සමූපකාර අමාත්‍යාංශය හරහා ගොවීන් 300 දෙනෙකුට පමණ රු 50,000 ආධාර මුදල් ලබා දී පොහොර නිෂ්පාදනයේ නිරත කරවන බවත්, ඉඩම් අමාත්‍ය එස්.එම් චන්ද්‍රසේන මැතිතුමා යටතේ මෙම බල ප්‍රදේශයේ මහ පරිමාණ කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක වන බවත්, සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> බල ප්‍රදේශයේ ගොවි සංවිධාන වලින් කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා අවශ්‍ය රසායනික පොහොර ලබා දෙන බවට සඳහන් කරමින් අයදුම්පත්‍රයක් ලබා ගත් නමුත්, එය අවලංගු කර නැවත හෙක්ටයාරයකට රු 12,500 ක මුදලින් හරි අඩක මුදලක් ලබා දී කෘෂිකර්ම

පර්යේෂණ නිෂ්පාදන සහකාර වරයෙකුගේ නිර්දේශය අනුව අදාල මුදල සම්පූර්ණයෙන්ම නිදහස් කරන බවත්, ඒ සම්බන්ධයෙන් නිවැරදි වැඩ පිළිවෙළක් නොමැති බවට පෙනීයන බැවින් ඒ පිළිබඳ සභාවේ මැදිහත් වීම සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා එවැනි කිසිදු ව්‍යාපෘතියක් නොමැති බවත්, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අදාල ව්‍යාපෘතිය කුමක්ද යන්න ඉදිරිපත් කල පසු අදාල ප්‍රතිපාදන හිමි වන බව සඳහන් කරන ලදී.

තවද ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා බොරළු වලක් පිළිබඳව විමසුවද ප්‍රාදේශීය සභාව සතුව බොරළු වලක් නොමැති බවත්, මීට පෙර ඇතැම් කාර්යයන් සිදු කලත් කිසිදු නෛතික අයිතියක් අප සතුව නොපවතින බවත්, ප්‍රාදේශීය සභාව සතු ඉඩම් ලැයිස්තුව තුල බොරළු වලෙන් අක්කර 100 ක භූමි ප්‍රමාණයක් පවතින බවට සඳහන් වන නමුත් එම ඉඩම්වල අයිතිය ප්‍රාදේශීය ලේකම් සතුව හෝ නොපවතින බවත්, ඒ සියල්ල වන රක්ෂණයට අයත් බවත් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ හැරිසෙන්ස් මැතිතුමා ප්‍රාදේශීය සභාව සඳහා බොරළු සහිත භූමියක් මිල දී ගැනීමේ හැකියාවක් නොමැතිද යන්න ත් එසේ සිදු කල හැකි වූවානම් බල ප්‍රදේශයේ මාර්ග සංවර්ධනය වෙනුවෙන් අවශ්‍ය බොරළු ඒ හරහා ලබා ගැනීමේ හැකියාව හිමි වන බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා බදු ගැනීමේ හැකියාව පවතින නමුත් ඒ පිළිබඳ මඳක් සලකා බැලිය යුතු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පි බන්දුලසේන මැතිතුමා සෑම ප්‍රාදේශිය සභාවක් සතුවම බොරළු වලක් නොපැවතියා වුවත්, ඔවුන් ආදායමක් ලබා ගන්නේ බල ප්‍රදේශයේ මාර්ග වල බොරළු ප්‍රවාහනය කිරීම සඳහා යම් මුදලක් අය කිරීම මත බවත්, අප ද මීටය පෙර එම ආදායම ලබා ගත් බවත්, දැනටත් භූ විද්‍යා ආයතනය මගින් අදාල බල පත්‍රය ලබා ගැනීම සඳහා මෙහි නිර්දේශයක් ලබා ගත යුතු බැවින් එම අවස්ථාවේදී ගාස්තු අය කල යුතු බවත්, අනෙකුත් ප්‍රාදේශීය සභා එම ගාස්තුව මේ වන විටත් අය කරගෙන යනු ලබන බවත්, සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මීට ඉහතදී භූ විද්‍යා ආයතනයෙන් අදාල නිර්දේශය ඉල්ලා සිටියත් මේ වන වන විට එය නතර කර ඇති බවත්, වෙනත් ප්‍රාදේශීය සභා ඒ වෙනුවෙන් වෙනම අතුරු ව්‍යවස්ථා සම්මත කර ගනිමින් එම ගාස්තුව අය කර ගෙන යන බවත් සභාව සතුව නෛතික හැකියාවක් නොමැතිව එලෙස ගාස්තු අය කිරීමේ හැකියාව නොමැති බවත් භූ විද්‍යා ආයතනය සභාවේ නිර්දේශය ලබා ගෙන අදාල ප්‍රවාහන බල පතුය නිකුත් කරන්නේ නම් අපට අදාල ප්‍රවාහනය කරන කියුබ් ප්‍රමාණයට ගාස්තු අය කර ගැනීමේ හැකියාව පවතින බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය තාක්ෂණ කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ඉදිරිපත් කල සංශෝධනයන්ට යටත්ව ක්‍රියාත්මක කල යුතු බව සඳහන් කරමින් ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසන ලද අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොකල බැවින් ඉදිරිපත් කල සංශෝධන වලට යටත්ව තාක්ෂණ කමිටු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03. 2021 ඔක්තෝම්බර් මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2021 ඔක්තෝම්බර් මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**2021 ඔක්තෝම්බර්**

| | | පැය ගණන |
|---|---|---|
| 01. එච්.එම්.එස්.ඩී චන්ද්‍රසිරි මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |
| 03. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 04. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 60 |
| 05. ඒ.ඒ පියතිස්ස මයා | (මං.කම්කරු (මුරකරු ආවරණ) | 40 |
| 06. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 50 |
| 07. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 08. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 09. සුභාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 60 |
| 10. පියල් බුද්ධික මයා | (අනියම් මාර්ග කම්කරු) | 40 |
| 11. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 75 |

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා 2021 ඔක්තෝම්බර් මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සම්බන්ධව යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2021 ඔක්තෝම්බර් මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**03.ප්‍රාදේශීය සභාවට අයත් කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානය 2021 වර්ෂයේ ඉදිරි මාස 03 සඳහා බදු දීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා පසුගිය කාලය පුරා පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ ජනතාවගේ අවශ්‍යතාවය වෙනුවෙන් එළවළු මිල දී ගෙන ගම් මට්ටමින් නිවෙස් ඉදිරියටම ගොස් වෙළඳාම් කර ජනතාව වෙනුවෙන් යම් සහනයක් සැළසූ බවත්, එහිදි ලක් වූ ප්‍රසාදය හමුවේ ආර්ථික මධ්‍යස්ථානයක් ආරම්භ කල යුතුයි යන සිතුවිල්ල තුල ප්‍රාදේශීය සභාවට අයත් කවරක්කුලම පිහිටි අදාල භූමිය තුල මෙම ආර්ථික මධ්‍යස්ථානය ඉදි කල බවත්, පසුව එය දෛනික ආදායමක් හිමි වන ලෙස වෙළෙන්දෙකු වෙත ලබා දී තිබුණු නමුත් නැවත මතු වූ කොවිඩ් වසංගත තත්වය හමුවේ ඔහුද සිය ව්‍යාපාරය නතර කිරීමට කටයුතු කිරීම තුල ආර්ථික මධ්‍යස්ථානය වසා දැමීමට සිදු වූ නමුත් එළබෙන වසරේ සිට ටෙන්ඩර් කර ලබා දෙන තෙක් ඉදිරි මාස 03 සඳහා සුදුසු පුද්ගලයෙකු වෙත ප්‍රසිද්ධ දැන්වීමක් පල කර ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ප්‍රාදේශීය සභාවට අයත් කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානය 2021 වර්ෂයේ ඔක්තෝම්බර්, නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුගමනය කරමින් වැඩිම ඉල්ලුම් මිලට සුදුසු පුද්ගලයෙකු වෙත ලබා දීමේ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සඳහා විරෝධතා පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රාෙදේශීය සභාවට අයත් කවරක්කුලම ආර්ථික මධ්‍යස්ථානය ඉදිරි මාස 03 සඳහා ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**04. තුරුළිය සෙවණ නිවාඩු නිකේතනයේ 2022 වර්ෂය තුල කුලිය අඩු කර ගැනීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රාදේශීය සභාවට අයත් මේ වන විට බදු දී ඇති තුරුළිය සෙවණ නිවාඩු නිකේතනයේ බදු කරු විසින් රටේ පවතින කොරෝනා වසංගත තත්වය හේතුවෙන් 2021 වසර සඳහා ටෙන්ඩර් ලබා දුන් මුදලට 20% ලෙස වූ වැඩි වන බදු ප්‍රතිශතය 5% දක්වා අඩු කරමින් සහනයක් ලබා දුන් සේ 2022 වර්ෂයේදී ද එම වැඩි වන බදු ප්‍රතිශතය 5% දක්වා අඩු කර දීමට කටයුතු කරන ලෙසට ඉල්ලීම් කර ඇති බැවින් එසේ සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය ආදායම් නොලබන බවට ප්‍රකාශ කර ඇතත්, සත්‍ය ලෙස ආදායම් ලබනවානම් ඒ සඳහා සහන සලසා දීම තුල සභා ආදායම් අහිමි කර ගැනීමක් සිදු වන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා 2021 වසරේදී අප ලබා දුන් සහනය අනුව බදු කරු වෙත සහනයක් හිමි වූ නමුත් 2022 වර්ෂය තුල රට යතා තත්වයට පත් වී හොඳ ආදායමක් ලබා ගත හැකි තත්වයට පත් වුවහොත් අද දින ගනු බදු ප්‍රතිශතය අඩු කිරීම සඳහා තීරණය කලහොත් ඒ තුල 2022 වර්ෂයේ ආදායම අහිමි වී යාම සිදු වන බැවින් එලබෙන වසරේදී පවතින තත්වය සලකා බලා සුදුසු තීරණයක් ගැනීම සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා තමාද හෝටලයක් පවත්වාගෙන යන පුද්ගලයෙකු ලෙස කොරෝනා වසංගත තත්වය හමුවේ වුවත් විවෘතව තිබූ බවත්, එසේම තුරුළිය සෙවණ නිවාඩු නිකේතනයද එලෙස විවෘතව තිබුණු බව තමන්ට නිරීක්ෂණය කිරීමට හැකි වූ බවත්, සඳහන් කරමින් සුදුසු නිරීක්ෂණයක් සිදු කර අදාල තීරණයට එළඹීම සුදුසු බවට සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු මන්ත්‍රී තුමන්ලාගේ අදහස් ප්‍රකාශ කිරීම අනුව සලකා බැලීමේදී ගිවිසුම පරිදි පමණක් ක්‍රියාත්මක කිරීමටත්, එළබෙන වසරේදී මෙම අයහපත් තත්වය දිගින් දිගටම පවතින්නේ නම් එය ඉදිරියේදී තීරණය කරමුයි යන්න යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරිහාමි මැතිණිය එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මේ වන විට ගිවිසුම් ගත වී ඇති පරිදිම තුරුළිය සෙවණට අදාලගාස්තු අය කිරීම සිදු කිරීම සම්බන්ධයෙන් වූ යෝජනාව සඳහා විරෝධතා පවතින්නේ ද යන්න

විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් එළඹෙන වසරේදී පවතින තත්වය පිළිබඳ සලකා බලා තීරණයක් ගැනීම සුදුසු බවට වූ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා ප.ව 01.10 සභා ගර්භයෙන් පිටව යන ලදී.

**05. ප්‍රාදේශීය සභාවට අයත් ටිපර් රථය හා බැකෝ ලෝඩරය කුලී පදනමින් ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අංක 513/19, බුද්ධගයා මාවත, අනුරාධපුර ලිපිනයේ පිහිටි ඩිස්කවර් හෙරිටේජ් ලංකා (පුද්) සමාගම විසින් වැව් ව්‍යාපෘතියක් සඳහා දීර්ඝ කාලීන බදු පදනම මත ප්‍රාදේශීය සභාවට අයත් ටිපර් රථය හා JCB යන්ත්‍රය ලබා දෙන ලෙසත්, අදාල ගාස්තුව දින 15 කින් 15 කට ගෙවීම සඳහා කටයුතු කරන බවටත් දන්වා සිටින බැවින් අදාල ඉල්ලීම ගිවිසුමක් අත්සන් කර බැංකු සුරක්ෂණයක් ලබා ගනිමින් ඉන්ධන හා රියදුරු සමඟ ගැසට් පත්‍රයේ සඳහන් මිල ගණන් අනුව ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ විමලසිරි මැතිතුමා ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ප්‍රාදේශීය සභාවට අයත් ටිපර් රථය හා බැකෝ ලෝඩරය කුලී පදනමින් ලබා දීමේ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**06. ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන -2021**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන -2021 යටතේ මෙම පළාත් පාලන ආයතනයට අදාලව පහත සදහන් ව්‍යාපෘති ඉටු කිරීම සඳහා අනුමැතිය ලබාදී ඇති බැවින් එම ව්‍යාපෘති වෙනුවෙන් ඇස්තමේන්තු සකස් කර බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධානය හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

| ව්‍යාපෘති අංකය | ග්‍රම නිළධාරී වසම | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන මුදල |
|---|---|---|---|
| SM/20/21/BP/762 | 261 අළුත්වැව | වීනිතා මියගේ නිවස ඉදිරිපිට සිට යෝධ ඇල දක්වා මාර්ගය කැටගල් ඇල්ලීම | 1,000,000.00 |
| SM/20/21/BP/763 | 263 ආමනේ | හේනපොලයාගම චන්ද්‍රානිපුර පාර විලච්චි මයාගේ නිවස ඉදිරිපිට ඇති පැති බැම්ම සහිත මාර්ගය කුට්ටි ගල් ඇල්ලීම | 1,000,000.00 |
| SM/20/21/BP/764 | 265 කුඩා නෙළුබැව | එගොඩගම පාර අවසානයේ කැටගල් ඇල්ලීම | 1,000,000.00 |
| SM/20/21/BP/765 | 266 මහ නෙළුබැව | ලොට් 100 පළමු පටුමඟ කැටගල් ඇල්ලීම | 1,000,000.00 |
| SM/20/21/BP/766 | 264 දිවුල්වැව | කිරිමැටියාව කරුණාරත්න මයාගේ නිවස ඉදිරිපිට මාර්ගය කැටගල් ඇල්ලීම | 1,000,000.00 |
| SM/20/21/BP/767 | 268 කළුආරච්චියාගම | 12 ඇල විහාරස්ථානය ඉදිරිපිට මාර්ගය කැටගල් ඇල්ලීම | 1,000,000.00 |
| SM/20/21/BP/768 | 269 පහලගම | කටුගම්පල ගම ධම්මික මියගේ නිවස ඉදිරිපිට මාර්ගය කැටගල් ඇල්ලීම | 1,000,000.00 |

| | | | |
|---|---|---|---|
| SM/20/21/BP/769 | 270 තුරුවිල | තුරුවිලගම අක්කරවත්ත මාර්ගය කැටගල් ඇල්ලීම | 1,000,0000.00 |
| LA/20/21/BP/1065 | 258 පොතානේගම | ඉහල වැව ඩෙස්මන් මහතාගේ නිවස අසල මාර්ගය/අක්කර 111 අනුලා මාවතෙහි දකුණු දෙසට ඇති දෙවන හරස් වීදිය කුට්ටි ගල් ඇතිරීම | 2,000,000.00 |
| LA/20/21/BP/507 | 245 වන්නියම්කුලම | ගුණානන්ද මාවතේ සිට ලෙනින් මාවත දක්වා අතුරු මාර්ගය | 2,000,000.00 |
| LA/20/21/BP/508 | 264 වන්නියම්කුලම | අනුලාදේවි මාවත 1 පටුමග මාර්ගය කුට්ටි ගල් ඇතිරීම | 2,000,000.00 |
| LA/20/21/BP/509 | 247 වන්නියම්කුලම | ධර්මරාජ මාවත රාහුල මාවත මාර්ගයේ ඉතිරි කොටස කුට්ටි ගල් ඇතිරීම | 2,000,000.00 |
| LA/20/21/BP/510 | 279 මහ කලත්තෑව | මිහිඳු මාවත මහින්ද සර්විස් මාර්ගයේ ඉතිරි කොටස කුට්ටි ගල් ඇතිරීම | 2,000,000.00 |
| LA/20/21/BP/511 | 280 තරියන්කුලම | තරියන්කුලම නළ ළිඳ අසල මාර්ගය | 2,000,000.00 |

<u>සංශෝධනය වූ ව්‍යාපෘති</u>

| ව්‍යාපෘති අංකය | ග්‍රාම නිළධාරී වසම | ව්‍යාපෘතියේ නම | ප්‍රතිපාදන මුදල |
|---|---|---|---|
| LA/20/21/BP/132 | 271 හිදෝගම | 104 පහල තුරුවිල මහ කඩේ ඉදිරිපිට මාර්ගය කුට්ටි ගල් ඇතිරීම | 2,000,000.00 |
| LA/20/21/BP/133 | 272 සුහදගම | සුදර්ශණාරාම විවේක සේනාසනය විහාරසිථාන මාර්ගයේ විහාරස්ථානයට අසල පාලමේ සිට නිහාල් එදිරිසිංහ මහතාගේ නිවස අසල මාර්ගය කුට්ටි ගල් ඇතිරීම | 2,000,000.00 |
| LA/20/21/BP/140 | 240 තම්මැන්නාකුලම | නුවර පාරේ සිට යසසිරිගම දක්වා ක්‍රවුන් බිස්කට් සමාගම අසලින් දිවෙන අතුරු මාර්ගය කුට්ටි ගල් ඇතිරීම | 2,000,000.00 |
| LA/20/21/BP/141 | 241 තම්මැන්නාපුර | ලයිසියම් පාසල අසලින් දිවෙන පැරකුම් මාවත කෙළවර මාර්ගයෙන් දිවෙන සුජිත් මහතාගේ නිවස දක්වා යන මාර්ගය කුට්ටි ගල් ඇතිරීම | 2,000,000.00 |
| LA/20/21/BP/797 | 245 වන්නියම් කුලම | පණ්ඩුකාබය මාවතේ ජයමාලි යෝගට් නිවස ඉදිරිපිට ඇති හරස් මාර්ගය මීටර් 100 කුට්ටි ගල් ඇතිරීම | 2,000,000.00 |
| LA/20/21/BP/151 | 277 කුඩා නෙළුම්කුලම | කුඩා කලත්තෑව වාහන සේවා ස්ථානය ඉදිරිපිට මාර්ගය කුට්ටි ගල් ඇතිරීම. | 1,200,000.00 |
| LA/20/21/BP/935 | 277 කුඩා නෙළුම්කුලම | නෙළුම්කුලම ටෙලිකොම් කණුව අසල මාර්ගය | 800,000.00 |

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> ඉදිරිපත් කරනු ලැබූ ව්‍යාපෘති බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධාන හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ඉදිරිපත් වී ඇති ව්‍යාපෘති කොන්ත්‍රාත් පදනමින් සිදු කිරීමේ යෝජනාව ඒකමතිකවම සභා සම්මත විය.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2021 සැප්තැම්බර් මස 09 වන දින මුදල් කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

- 2021 සැප්තැම්බර් මස 13 වන දින තාක්ෂණ උපදේශණ කමිටු වාර්තාව

**සභා ගත කරන ලදී.**

- 2021 අගෝස්තු මස 27 වන දින ප්‍රසම්පාදන කමිටු වාර්තාව

**සභා ගත කරන ලදී.**

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2021 අගෝස්තු  මස  ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා වියදම් වාර්ථාවේ පරිපාලන වියදම්, සේවක වැටුප් , මන්ත්‍රී දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා විරුද්ධ වන බව සඳහන් කරන ලදී

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශිමාලි මැතිණිය 2021 වර්ෂය වෙනුවෙන් සකස් කර තිබූ අයවැය මෙතෙක් ලබා දී නොමැති බැවින් ඒ පිළිබඳ සලකා බලන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බිඅ කුමාරදාස මැතිතුමා 2021 වර්ෂයේ අයවැය තුල පැවති තොරතුරු වල අඩු පාඩු කිහිපය සකස් කර නැවත මුද්‍රණය කර නොහැකි බැවින් එම අයවැයම අඩු පාඩු සහිත පිටු පමණක් ඉවත් කර සකස් කර දීම සඳහා ලබා දුන් අයවැය ලේඛන නැවත භාර දෙන ලෙස ප්‍රකාශ කලත් ගරු මන්ත්‍රීවරුන් 04 දෙනෙකු හැර අනෙක් ගරු මන්ත්‍රීවරුන් භාර නොදුන් බැවින් එලෙස ලබා දිය නොහැකි වූ බව සඳහන් කරන ලදී. තවද 2022 වර්ෂය සඳහා අයවැය යෝජනා ඉදිරිපත් කරන ලෙසට ප්‍රකාශ කලත් මෙතෙක් ලබා නොදුන් බවත්, ඉල්ලුම් කරන තොරතුරක් සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමන්ලා අවධානය යොමු කර අවශ්‍ය අවස්ථාවේදී ලබා දීමට කාරුණික වන ලෙස සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී පී කරුණාරත්න මැතිතුමා ආදායම් වියදම් වාර්ථා මුද්‍රණය කිරීමේදී අපැහැදිලි වී ඇති බැවින් එළඹෙන මහ සභාවේදී එය එසේ නොවේවි යයි බලාපොරොත්තු වන බවත්,

නැණපියස වැඩසටහන යටතේ තුරුවිල ග්‍රාම නිළධාරී කොට්ඨාශය සඳහා ග්‍රාම නිළධාරී කාර්යාලයක් හා සංවර්ධන කාර්යාලයක් ස්ථාපිත කිරීමට ප්‍රතිපාදන වෙන් වී තිබුණා වූවත් එය ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිණිය ජන උදාන ගම්මානය වෙත එම ගොඩනැගිලි ඉදි කිරීම සඳහා යෝජනා කර ඇති නමුත් සුදුසු ම ස්ථානය වන්නේ අසරණ සරණ මරණාධාර සමිතියේ වෙන් කර ඇති භූමි ප්‍රමාණය තුල බවත්, ගමේ වැඩි

පිරිසක් එම ස්ථානයේ මෙම ඉදි කිරීම සිදු කරන්නේ නම් සුදුසු බවට එකඟතාවය පල කර ඇති බවත්, සඳහන් කරන ලදී.

තවද ජන උදාන ගම්මානය ජනතාවට ප්‍රවිශ්‍ය වීමට දැඩි අපහසු ස්ථානයක් බවද සඳහන් කරන ලද අතර, ජනතාවගේ පහසුව අනුව අදාල කාර්යාලය පිහිටුවීම සඳහා අවධානය යොමු කල යුතු බැවින් ගරු සභාපතිතුමා මැදිහත් වීම සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා</u> පොහොර නිෂ්පාදන මධ්‍යස්ථානය ඉදි කරනු ලබන බවට වූ ව්‍යාපෘතියට අදාල ව්‍යාපෘති වාර්ථාව තුල ගම්මාන 61 පවතින බවට සඳහන් කර ඇතත් සත්‍ය ලෙසම බල ප්‍රදේශය තුල ගම්මාන 160 ක් පවතින බවත්, සභාවේ පවතින මෙම පොදු තොරතුරු කිසි ලෙසකින්වත් වෙනස් විය නොහැකි බවත්, 2021 වර්ෂය වෙනුවෙන් ලබා දී තිබූ අයවැය සම්පූර්ණයෙන්ම වැරදී බවත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා</u> අතුරු ව්‍යවස්ථා පනවා ගැනීම සම්බන්ධ සාකච්ඡාවක් පවත්වා ඒවා පැනවීමට තීරණය කල නමුත් මෙවරද එම යෝජනාව සභාවට ඉදිරිපත් නොකලේ මන්ද යන්නත්, ප්‍රාදේශීය සභාව විසින් අංක 261 වදාකඩ ග්‍රාම නිළධාරී තුලානයේ පිහිටි වැවේ පස් අලෙවි කිරීමට කටයුතු කරන බවට රාවයක් පවතින බැවින් එහි සත්‍ය අසත්‍ය තාවය කුමක්ද යන්න විමසන ලදී.

තවද නාච්චාදුව සුහඳගම ගම්මානයේ සංවර්ධනය කිරීමට නියමිත මාර්ගය නියමිත පළලින් යුතුව තිබුණා වුවත්, එම මාර්ගය අඩි 10 කට කුට්ටි ගල් අතුරා සංවර්ධන කිරීමට කටයුතු කරන බැවින් එය නතර කොට සුදුසු පළලින් සකස් කරන බවට ගරු සභාපතිතුමා එකඟ වූ බවත්, දැනට එහි ප්‍රගතිය කෙසේද යන්න විමසන ලදී.

තවද අදාල මාර්ගයේ සීමාව නිරාකරණය වූ පසු කොට්ඨාශයට හිමි වන විමධ්‍යගත ප්‍රතිපාදන හරහා සංවර්ධනය කරන ලෙස කොට්ඨාශ භාර ගරු මන්ත්‍රීවරයා වෙත උපදෙස් ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලද අතර නෙළුම්කන්නිය පන්සලට යන මාර්ගයේද ගැටළුවක් පවතින බව සඳහන් කරන ලදී.

තවදුරටක් අදහස් දැක්වූ ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා පොහොර භාවිතා නොකර හෝ වී ගොවිතැන සිදු කල නමුත් අද වන විට ගොවීන්ගේ වී මිල දී ගැනීමට රජය විසින් සුදුසු වැඩ පිළිවෙලක් නොමැති වීම මත විකුණා ගැනීමට නොහැකි වී ඇති බැවින් ඒ පිළිබඳ සාධාරණ මැදිහත්වීමක් සභාව විසින් සිදු කරන ලෙස ප්‍රකාශ කරන ලදී. තවද වැඩි ප්‍රමාණයක් වී තොග ගබඩා කර තබා ගැනීමට නොහැකි වීම මත පෞද්ගලික මෝල් හිමියන්ද වී මිල දී ගැනීම සිදු නොකරන බැවින් රජය මැදිහත් වී නාඩු වී 1 kg රු 60 ක මුදලකටද, සම්බා වී 1 kg රු 65.00 කටද, කීරි සම්බා වී 1 kg රු 70.00 ක මුදලකටද මිල දී ගැනීමට රජය දැනුවත් කරන ලෙස ප්‍රකාශ කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> අතුරු ව්‍යවස්ථා තුල යම් යම් ගැටළු කිහිපයක් පවතින බැවින් තව දුරටත් අධ්‍යයනය කර පැනවිය යුතු අතුරු ව්‍යවස්ථා නිවැරදිවම හඳුනාගත් පසුව සභාවට ඉදිරිපත් කර එකවරම සියළු අතුරු ව්‍යවස්ථා පැනවීමට සභා තීරණයක් ගනිමුයි යන්නත්, 261 වදාකඩ වැවෙහි පසු විකිණීමේ ව්‍යාපාරය සම්බන්ධයෙන් සභාවේ කිසිදු ගණුදෙනුවක් නොමැති බවත්, ප්‍රාදේශීය සභාවට අයත්, බැකෝ ලෝඩරය හා ටිපර් රථය කුලී පදනමින් ලබා දී ඇති බවත් සඳහන් කරන ලදී.

තවද සුහඳගම මාර්ගය සංවර්ධනය කිරීමට නියමිත වූ ව්‍යාපෘතිය මේ වන විට සංශෝධනය කර ඇති බවත් මෙම මාර්ගය පුළුල් කිරීම වෙනම සභාව මැදිහත් වී සිදු කරන බවත්, සඳහන් කරන ලදී.

තවද නෙළුම්කන්නිය පන්සලට යන මාර්ගයේ වූ ගැටළුවද මේ වන විට විසඳී අවසන් බව සඳහන් කරන ලදී.

තව දුරටත් අදහස් දැක්වූ ගරු සභාපතිතුමා පොහොර මිල දී ගැනීම සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමා සඳහන් කල පරිදී ගැටළුවක් නොමැති බවත්, එසේ වී විකුණා ගත නොහැකි වූ ගොවීන් සිටීනම් ඒ පිළිබඳ ලැයිස්තුවක් ලබා දෙන ලෙසත්, සඳහන් කල මිල ගණන් වලට නොවූවත්, මිල දී ගැනීම සඳහා වැඩපිළිවෙලක් සකස් කරන බව සඳහන් කරන ලදී.

<u>ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා</u> නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුල සම්පූර්ණයෙන් මිල දී ගැනීම අවසන් කර ඇති බවත්, ගරු මන්ත්‍රී ආර්.එම් කුමාරසිංහ මැතිතුමා සඳහන් කල පරිදී වූ මිල යටතේ වී මිල දී ගැනීම තුල 70% පමණ සිටින පාරිබෝගික ජනතාව කොපමණ අපහසුතාවයට පත් වන්නේ ද යන්නත්, අප ඒ පිළබඳව ද සාධාරණව සිතිය යුතු බවත්, වී අලෙවි කිරීමේ හැකියාව නොමැතිනම් වී අලෙවි මණ්ඩලය විසින් වී මිල දී ගැනීම සිදු කල බව සඳහන් කරන ලදී.

අනතුරුව ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා, බල ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2021.09.22 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 01.46 ට අවසන් කරන ලද අතර එළබෙන මහ සභාව 2021.10.22 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

..................................
බී.එච් ප්‍රදීප් නිශාන්ත
ලේකම්,
නැ.නු.ප ප්‍රාදේශීය සභාව,
විජයපුර.

..........................................
එස්.බී කුමාරදාස මැතිතුමා
සභාපති ,
නැ.නු.ප්‍රාදේශීය සභාව,
විජයපුර.